

# තීරුව

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි කරන ලදී.

යහපත් වූ වරායක
නත්කල් දැක්ම

පස්වන කාණ්ඩය / 12 වන කලාපය / 2018 අප්‍රේල්


02 පිටුව ග්ලෝබල් පෝර්ට් ෆෝරම් සම්මානය...

07 පිටුව *What's happening around us ?*

09 පිටුව නිපෝන්මාරු


## කොළඹ වරාය ප්‍රවර්ධනයට
# ප්‍රධාන පර්යන්ත ත්‍රිත්වය එක්වේ


Con. 10

ලෝකයේ නාවික ක්ෂේත්‍රය හේතුවෙන් ආදායම් ලබන රටවල් ඇත්තේ කිහිපයකි. එය නාවික ගමනා ගමනය බිහිවූදා සිට පවතින භූගෝලීය පිහිටීම අනුව රටවල් කිහිපයක් ලද දායාදයක් සේම, නූතන කාර්මික විප්ලවය හේතුවෙන් ජගත් නාවික මාර්ගය වෙනස්වීම නිසා එම භාග්‍ය ලද රටවල් කිහිපයක පමණක් සඳහාම ලැබෙන සුවිශේෂී තත්ත්වයකි. රේඛාවක් ලෙස ගතහොත් පැනමා ඊජිප්තුව, ඉරානය, ශ්‍රී ලංකාව, සිංගප්පූරුව, ජපානය යන රටවල් සිය භූගෝලීය පිහිටීම නිසාම ක්ෂේත්‍රය තුළ මඟ නොහැරිය හැකි සන්ධිස්ථානයන්හි පිහිටීම රටක් ලෙස අපලැබූ භාග්‍යයකි.

හම්බන්තොට වරාය බදු දීමෙන් කොළඹ වරාය ණයබරින් නිදහස් කළාසේම කොළඹ වරාය හා සබැඳි සහෝදර පර්යන්තයන් සමඟ සහයෝගීතා ගිවිසුම්ගතවීම තුළ සමුද්‍රීය කලාපයේ තරගකාරීත්වයට ද අපි ප්‍රබල දායකත්වයක් සපයන බැව් මෙවර සම්බන්ධිත වරායයන් අතර කොළඹ වරාය මුල් පෙළට පැමිණීම තුළ අප ඔප්පු කළෙමු. එය පාලනාධිකාරියේත් සේවක ඔබ සැමගේත් ජයග්‍රහණයකි. එමතු නොව ගාල්ල, ඔලුවිල්, ත්‍රිමලය, කන්කසන්තුරය ආදී වරායයන් එකිනෙකට වෙනස් වඩාත් සුදුසු උපාය මාර්ගික සැළසුම් වලට අනුව සංවර්ධනය කරා මෙහෙයවීමට ද කටයුතු කරමින් සිටියි. එය හෙට දවසේ ඒ ඒ වරායයන් සුදුසු පරිදි ආදායම් ඉපැයීමට හැකි සංවර්ධනයක් ජනිත කිරීමකි.

නිරන්තරව වර්ධනය වන කලාපයේ බහලු මෙහෙයුම් ධාරිතාව කොළඹ වරාය තුළ රඳවා ගනිමින් වැඩි විදේශ විනිමයක් ලබා ගැනීම අරමුණු කර ගනිමින්, කොළඹ වරාය වෙත හෙට දවසේ තැනෙන සුවිසල් යාත්‍රා ආකර්ශනය කර ගැනීමේ, එකම තුරුම්පුව වන නැගෙනහිර පර්යන්තයේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම මෙන්ම ඒ සියලු කටයුතු වරාය අධිකාරිය යටතේ සිදු කිරීමට මේ වන විට සියලු පිඹුරුපත් සැකසෙමින් පැවතීම ඔබේත් මගේත් මතු නොව දැයේ දූ පුතුන්ගේ ද වාසනාවක් බැව් පැවසීම අතිශෝක්තියක් නොවේ.

කොළොම්තොට ඇතුළු සියලු නැව්තොටවල් දැයේ දූ පුතුන්ගේ රැකියා වරම් ලෙසින් අවස්ථා සලසාදීම කළ යුතු සේම ඔවුන් සතු දැනුම කුසලතා ඔස්සේ වරාය අධිකාරියේ මානව සම්පත් හූයට එක්කිරීමට නිසි ක්‍රමවේදයක් ද සැළසිය යුත්තේම ය. එවිට කොළොම්තොටින් ආදර්ශ ගෙන සිංගප්පූරු ගොඩ නැගූවන් නැවතත් බුහුමන් පෙර දැරිව අපව ඔසවා තබනු ඇත.




## සාමූහිකත්ව ප්‍රවේශය

**කළමණාකරණ කර්තෘ**
නලින් අපොන්සු

**නිරීක්ෂණය**
චිත්‍රාල් ජයවර්ණ
හර්ෂ උදයකාන්ත පීරිස්
කාව්‍ය ඉන්ද්‍රජිත්

**සංස්කරණය**
උපුල් ගුරුගේ

**පිටු සැකසුම**
උදිත චන්දන

**සහාය පිටු සැකසුම**
දිමුතු තෙන්නකෝන්

**පරිගණක අකුරු ඇමුණුම**
රේණුකා දමයන්ති

**තාක්‍ෂණික සහාය**
රුක්‍ෂාන් සමරධීර
අසංක රාජපක්‍ෂ

**ඡායාරූප**
ඩී.කේ. වැලිකල
මහින්ද තෙන්නකෝන්

**සම්බන්ධීකරණය**
දිල්රුක් ජයසේකර
සංජීව විජේසේකර
දේවිකා හෙට්ටිආරච්චි
සන්ධ්‍යා විතාන
එම්.එෆ්.එෆ්. ෆර්සානා

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ ප්‍රකාශනයකි**


## ග්ලෝබල් පෝර්ට් ෆෝරම් 2018 වසරේ වරාය අධිකාරිය සම්මානය

# ශ්‍රී ලංකා වරාය අධිකාරිය ට




ග්ලෝබල් පෝර්ට් ෆෝරම් විසින් සිව්වැනි වරට පවත්වන ලද සම්මාන උළෙලේ '2018 වසරේ වරාය අධිකාරිය' සම්මානය දිනා ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමත් වි ය. පසුගිය දා ඩුබායි හි ග්‍රෑන්ඩ් හයාට් (Grand Hyatt) හෝටල් පරිශ්‍රයේ පැවැති මෙම සම්මාන උළෙලේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය නියෝජනය කරමින් ප්‍රධාන කළමණාකරු (අලෙවි හා ව්‍යාපාර ප්‍රවර්ධන) උපුල් ජයතිස්ස මහතා සහ ප්‍රධාන කළමණාකරු (සන්නිවේදන හා මහජන සම්බන්ධතා) නලින් අපොන්සු මහතා විසින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ සබඳතා හා ජාත්‍යන්තර සහයෝගිතා අමාත්‍යංශයේ, ආර්ථික සහ වෙළඳ සම්බන්ධතා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා මූනා අල් මැයිනි මහත්මියගේ සුරතින් මෙම සම්මානය ලබා ගන්නා ලදී.

වරාය උපාය මාර්ගික සැලැසුම් සහ වරාය සංවර්ධනය, වරාය ස්වයංක්‍රීයකරණය, වරාය මූල්‍යකරණය සහ මෙහෙයුම් ඵලදායීතාවය පිළිබඳ සාකච්ඡා ඇතුළත් දෙදිනක විශේෂ සම්මේලනයක් ද මෙම සම්මාන උළෙලට සමගාමීව පැවැත්විණි.

2008 වසරේ සිංගප්පූරුවේ කොස්මොපොලිටන් ග්ලෝබල් පෝර්ට් හි දී ව්‍යාපාරිකමය අරමුණු මුල් කර ගනිමින් ආරම්භ කරන ලද ලෝක වරාය සැසිය (Global Ports Forum - GPF) විසින් වාර්ෂිකව මෙම සම්මාන උළෙල සංවිධානය කරනු ලබයි. එහි දී සාමාජික වරායයන්ගේ ක්‍රියාකාරීත්වය හා එහි ඉදිරි සංවර්ධන දායකත්වය පිළිබඳ නිරන්තර සැලකිල්ලට ගනු ලැබේ.

මෙවර සම්මාන උළෙලේ දී ප්‍රශස්ත දායකත්වය හා වෘත්තීයමය ස්වභාවයෙන් යුතුව කටයුතු කරනා වෙසෙස් ප්‍රදේශයන් හි වරාය සහ පර්යන්ත පිළිබඳ සහ ඒවායේ සාර්ථකත්වය ළඟා කර ගැනීම පිළිබඳ අවධානයට සහ ඇගැයුමට ලක් කරමින් ක්ෂේත්‍ර ගණනාවක් යටතේ මෙම සම්මාන පිරිනැමීම සිදු කෙරිණි. කොළඹ වරායේ SAGT පර්යන්තය දකුණු ආසියාවේ විශිෂ්ටතම පර්යන්තය ලෙස පසුගිය වසරේ දී සම්මානයට පාත්‍ර වූ අතර, අඛණ්ඩ ලෙස මෙවරත් එම සම්මානයට හිමිකම් කියනු ලැබිණ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ කොළඹ වරායේ මේසා සුවිසල් විජයග්‍රහණයෙහි ලා වත්මන් රජයේ වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ විශිෂ්ට නායකත්වයත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගරු සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතාගේ නිසි මගපෙන්වීම හා කළමණාකාරීත්වයත්, වරාය මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධ සියළුම පර්ශවයන්ගේ දායකත්වය හා වෘත්තීය සමිති මෙන් ම සමස්ථ වරාය සේවක මහත්ම මහත්මීන් අතර පැවැති සහ සම්බන්ධතාවය ඉතා ප්‍රශස්ත ලෙස වර්ධනය වී තිබීම ද තුළින් මෙවන් ජයග්‍රහනයක් කරා ළඟා වීමට හේතු වී තිබේ.

එමෙන් ම මේ වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් තුන් අවුරුදු සංවර්ධන සැලැස්මක් සකස් කර ඇති අතර, ඒ මගින් ඉදිරි කාලය තුළ දී සංවර්ධන කටයුතු වඩාත් වේගවත් ව ඉදිරියට ගෙන යාමටත්, ඒ තුළින් බහලු මෙහෙයුම් තව දුරටත් ඉහළ නංවමින් කොළඹ වරාය ආසියාවේ කේන්ද්‍රීය වරාය බවට කිරීමට අපේක්ෂිත ය.

**සටහන -උපුල් ගුරුගේ**



# ප්‍රාදේශීය වරාය සංවර්ධනයට පියවර

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෑත ඉතිහාසයේ ලබපු වැඩිම ලාභය 2017 දී අපි ලැබුවා. ඒ බිලියන 13.3 ක් ඒ නිසාම අපි වෘත්තීය සමිති 24 සමඟ ම කතා කරලා මූලික වැටුපට රු. 5000 ක් එකතු කිරීමත් තව රු. 5000 ක් දීමනා වලටත් එකතු කළා.

අනාදිමත් කාලයක සිට ජනතා ආකර්ශනයට පාත්‍ර වූ කොළොම්තොට හෙවත්, කොළඹ වරාය සමුද්‍රීය කලාපයේ කේන්ද්‍රීය වරාය බවට පත්වීමට යන ගමනේ දී, රට වටා පිහිටි ප්‍රාදේශීය වරායයන් සංවර්ධනයට ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය පියවර ගෙන තිබේ.

මෙතෙක් කිසිදු සංවර්ධන කටයුත්තකට යොමු නොවූ උතුරුකරයේ පිහිටි කන්කසන්තුරේ වරාය නවීකරණයට කටයුතු ආරම්භ කර තිබේ. ඉන්දීය රජයෙයන් ඇ.ඩො. මිලියන 40 ක් සහනදායි ණය ක්‍රමයක් යටතේ ලැබී ඇති අතර, එම මුදලින් කඩිනම් වරාය සංවර්ධන ක්‍රියාමාර්ගයක් වෙත යොමුවීමට නියමිතය. වරාය පරිශ්‍රය සතු භූමිය සීමාසහිත හෙයින් ඒ ආශ්‍රිත රජය සතු ආයතනය පරිශ්‍ර කිහිපයක ඉඩකඩ වරාය සංවර්ධනය සඳහා උපයුක්ත කර ගැනීමට අපේක්ෂිත ය.

## ත්‍රි’මලය වරාය එක බිම් අඟලක්වත් විකුණන්නේ නෑ

ලොව විශාලතම ස්වභාවික වරායන් අතර ප්‍රමුඛ වරායක් සේ සැලකෙන ත්‍රිකුණාමලය වරාය සංවර්ධනයට පියවර ගන්නා බැව් වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා පැවසීය. සිංගප්පූරුවේ ප්‍රමුඛ පෙළේ ශක්‍යතා අධ්‍යයන සමාගමක් විසින් පසුගියදා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩපිළිවෙළ පිළිබඳ මූලික සැළැස්මක් සකස් කරන ලදී. එම සැළසුම් සඳහා අක්කර 5000 ක පමණ ප්‍රමාණයක් ඇතුළත් වන අතර වරාය පරිශ්‍රය සතු ඉඩම් ද ඒ සඳහා ඇතුළත් වේ. වරාය සතු එම ඉඩම් විවිධ ව්‍යාපෘති සඳහා යොදවා ගැනීමටත් ඒ තුළින් නව රැකියා අවස්ථා උත්පාදනයටත් අවකාශය සලසා ඇත. එමෙන්ම, ත්‍රි'මලය වරාය සතු භූමිය නිවැරදිව හඳුනා ගනිමින් ඒ සඳහා නිසි බලපත්‍ර ලබා ගැනීමට ද මේ වන විට කටයුතු කර ඇත.

## ඔලුවිල් ලාභදායි වරායක් කිරීමට රජයේ අවධානය

දැනට වරාය මෙහෙයුම් කටයුතු සිදු නොවන ඔලුවිල් වරාය වාණිජ මට්ටමින් ලාභදායි වරායක් බවට පත් කිරීමට අවධානය යොමු කර ඇත.

මේ අනුව වරාය තුළ ගැඹුරු කළ යුතු ස්ථාන පිළිබඳව සහ වරාය අධිකාරිය සතු නිවාඩු නිකේතන සංවර්ධනය සම්බන්ධව ද අවධානය යොමු කර ඇත.

වරාය දියුණු කිරීම පිළිබඳ කැබිනට් මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර වරායේ ඉදිරි කාර්යභාරය විධිමත් කිරීම සඳහා සැළසුම් සකස් කිරීමට ද පියවර ගෙන තිබේ.

මේ වන විට සමුද්‍ර ඛාදනය නිසා ඔලුවිල් වරාය තුළට දිගින් දිගටම වැලි ගලාගෙන ඒම නිසා වරාය තුළ නැව් මෙහෙයුම් කටයුතු සිදු කිරීමට නොහැකි වී තිබේ. එබැවින් වරාය තුළ අඛණ්ඩව වැලි ඉවත් කරන යන්ත්‍රයක් රඳවා වරාය තුළට පැමිණෙන වැලි අදාල යන්ත්‍රය මගින් මුහුදු ඛාදනය සිදුවන ප්‍රදේශයට පොම්ප කිරීමට ද සැළසුම් කර ඇත. මීට අමතරව අවට ප්‍රදේශවල සිටින අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ද විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීමට නියමිතය.

පවතින වෙරළ ඛාදනය නිසා වරායයන් මෙන්ම ඒ ආයතනයේ පවතින ධීවර වරායේ කටයුතු වලට ද බාධා එල්ල වී තිබේ.

## කොළඹ වරාය මහජන ප්‍රදර්ශනයට

කොළඹ වරාය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට කටයුතු කරන බැව් අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා පැවසීය. වරාය හා නාවික අමාත්‍යවරයා මේ බැව් සඳහන් කළේ වරාය හා නාවික අමාත්‍යාංශයේ පැවති මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

රටේ පැවති යුද්ධය අවසන් කර වසර කිහිපයක් ගතවී ඇති අතර ත්‍රස්තවාදයක් නොමැති වකවානුවක වරාය වැනි ස්ථාන රටේ ජනතාවට දැක ගැනීමට අවස්ථාව ලබා දිය යුතු බව වැඩිදුරටත් අදහස් දක්වමින් අමාත්‍යවරයා පැවසීය.

තවද මේ සම්බන්ධයෙන් ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා සමඟ සාකච්ඡා කළ බවත්, වරාය මහජනතාවට විවෘත කිරීමට ජනපතිවරයා ද එකඟතාව පළකළ බැව් ඇමතිවරයා පැවසීය.

මේ වන විට වරායට වාහනයක් ඇතුළු කර ගැනීම ඇතුළු බොහෝ කටයුතු වලට අවසර ගැනීමට සිදුව ඇති බවත්, වරාය විවෘත කිරීමෙන් පසු එම කාර්යන්වලට සහන ලැබෙන බවත් අමාත්‍යවරයා පැවසීය.

ජනතාවට වරාය සංචාරය කිරීමටත්, විනෝදවීමටත් පූර්ණ අවසරය ලබා දීමට අමතරව සංචාරක රුවල් නැව් කර්මාන්තයක් ඇති කිරීමටත් පියවර ගන්නා බැව් සඳහන් කළ අමාත්‍යවරයා සංචාරක ව්‍යාපාරය පුළුල් කිරීමේ කාර්ය තුළ සංචාරක රුවල් නැව් යොදා ගැනීම පිළිබඳ ශක්‍යතාව සොයා බැලීමේ අවශ්‍යතාවයක් පවතින බවත් වැඩිදුරටත් අදහස් දක්වමින් වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා පැවසීය.

තමාගේ ධූර කාලය තුළ කිසිදු වැඩ වර්ජනයක් වරාය පරිශ්‍රය තුළ සිදු නොවූ බව වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා පැවසීය. අමාත්‍යවරයා මේ බැව් පැවසුවේ අමාත්‍යංශ ශ්‍රවණාගාරයේ පැවති මාධ්‍ය හමුවක් අමතමිණි.

එහිදී අමාත්‍යවරයා මෙසේ ද පැවසී ය. ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෑත ඉතිහාසයේ ලබපු වැඩිම ලාභය 2017 දී අපි ලැබුවා. ඒ බිලියන 13.3 ක් ඒ නිසාම අපි වෘත්තීය සමිති 24 සමඟම කතා කරලා මූලික වැටුපට 5000 ක් එකතු කිරීමත් තව 5000 ක් දීමනා වලට එකතු කිරීමටත් පොරොන්දු වුණා. මෙම අමාත්‍යාංශය භාරගන්නා විට (2015) බිලියන 14.1 ක් පාඩු ලැබුවා. නමුත් අද විශාල වශයෙන් වරාය ලාභ ලබනවා. ඉතිහාසය දෙස හැරී බැලීමේ දී 2006 වසරේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය රුපියල් මිලියන 251 ක ලාභයක් ලබා තිබෙනවා. 2007 වසරේ දී එය රුපියල් මිලියන 10,500 ක අලාභයක් වුණා. 2008 වසරේ දී රුපියල් මිලියන 10,500 ක අලාභයක් ද, 2009 වසරේ දී රුපියල් මිලියන 2100 ක ලාභයක් ද, 2010 වසරේ දී රුපියල් මිලියන 1000 ක අලාභයක් ද, 2011 වසරේ දී රුපියල් මිලියන 583 ක ලාභයක් ද, 2012 වසරේ දී රුපියල් මිලියන 2396 ක ලාභයක්, 2013 වසරේ දී රු. මිලියන 1571 ක ලාභයක්, 2014 දී රු. මිලියන 8896 ක ලාභයක් ද, 2015 වසරේ දී 14168 ක අලාභයක් ද, 2016 වසරේ දී රු. මිලියන 1036 ක ලාභයක් ද, 2017 වසරේ දී රු.මිලියන 13,324 ක ලාභයක් ලැබුවා. එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලැබූ සුවිසල් ජයග්‍රහණයන් බව පැවසිය යුතු ය.

ඒ ලාභයට දායක වූ අයටත් ලාභය ලබා දිය යුතුයි. එකම එක වෘත්තීය සමිතියක් පමණක් ඊට එරෙහිව කටයුතු කළා. නමුත් සමස්තය කැමතියි. අප සියලු පාර්ශවයන් පිළිබඳ සලකා බලනවා. මොකද වෘත්තීය සමිති සමඟ අපි කවදාවත් ගැටුම් ඇති කර නොගන්න නිසා. ඒ වගේම සඳහන් කළ යුතුයි මෙම ලාභ ලැබීම සඳහා විවිධ අංශ දායක වුණ බව, ප්‍රතිඅපනයන 20% ක වර්ධනයක් සිදුවීම සහ බහලුම් මිලියන 6 ක ඉලක්කය සපුරාලීමත් මෙම ලාභ ලැබීමට උපකාරී වුණා. ඒ වගේම 2016 වර්ෂයට සාපේක්ෂව අපට ගිය වියදම් 2017 වර්ෂයේ අඩුයි. එකම හේතුව හම්බන්තොට වරාය බදු දීම මගින් විශාල ණය බරක් නිදහස් වීමයි.

මේ නව වැටුප් වැඩිවීමත් සමඟ සේවක මහත්ම මහත්මීන්ගේ අර්ථ සාධක, ඊ.ටී.එෆ් පාරිතෝෂික ඇතුළු දීමනාවන් ද වැඩිවෙනවා ඇති. සැබවින්ම මෙම වැඩපිළිවෙළේ අරමුණ ලාභය ලැබීමට දායක වුණු පිරිස් අමතක නොකිරීමයි. මේ සඳහා මිලියන 2300 ක් වැයවෙනවා.

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ක්‍රියාත්මක නොවීම නිසා පසුගිය කාලයේ රුපියල් මිලියන 3500 ක පමණ ආදායමක් අහිමි වුණා. එහි කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ ගෙන එන එක විතරයි මේ වන විට තිබෙන්නේ. මේ වන විට ලෝකයේ භාණ්ඩ ප්‍රවාහනය සිදු කරනු ලබන නෞකාවන්ගේ විශාලත්වය පුළුල් වීමට සරිලන විදියට ජයබහළු පර්යන්තයේ ගැඹුර මදි. අපට ගැඹුරු පර්යන්තයන් තියෙන්නේ CICT පර්යන්තය විතරයි. මේ නිසා නැගෙනහිර පර්යන්තය කඩිනම් සංවර්ධනයට අවසර ඉල්ලා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා.


**සටහන -උපුල් ගුරුගේ**

තීරථ

# සමගිය බලයට හැරවූ

## දොඹකර අලුත්වැඩියා සහ ඩීසල් යන්ත්‍ර අලුත්වැඩියා බලඇණිය








ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව පවතින විශාලතම වටිනාම සහ නවීන ස්වයංක්‍රීය අංගෝපාංග වලින් සමන්විත KATO (KA 900) ටොන් 90 ජංගම දොඹකරය 2017.04.30 දින ඇති වූ හදිසි ගිනි ගැනීමක් හේතුවෙන් යලි ක්‍රියාකාරි තත්ත්වයට ගත නොහැකි ලෙස අබලන් විය.

මෙම දොඹකරය සියලුම ග්‍රැන්ට් දොඹකර සහ ජංගම දොඹකර වල අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා දැනට භාවිත කරන කාර්යක්ෂමතාවයෙන් ඉහළම අධිකාරිය සතු ජංගම දොඹකරය වේ.

මෙය අලුත්වැඩියා කිරීමට බාහිර තාක්ෂණික සේවා සපයන හා නියෝජිත ආයතන අපොහොසත් වන අවස්ථාවේ මෙම මාහැඟි දොඹකරයේ අවශ්‍යතාවය හා වටිනාකම අවබෝධ කරගත් ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ) එම්.එස්.පතිරණ මහතා ඇතුළු නිළධාරීන් මෙම දොඹකරය යථා තත්ත්වයට පත් කිරීමේ සම්පූර්ණ කාර්ය දොඹකර අලුත්වැඩියා අංශයට හා ඩීසල් යන්ත්‍ර අලුත්වැඩියා අංශයට පවරන ලදී.

එහිදී දොඹකර අලුත්වැඩියා අංශයේ යාන්ත්‍රික ඉංජිනේරු එම්.එම්.එස්.ආර්.සිල්වා මහතා, වැඩ කළමණාකරු එල්.පී.ටී.පුෂ්පකුමාර මහතා ඇතුළු පරිපාලක මහතුන් සහ තාක්ෂණික ශිල්පීන්ගේ පූර්ණ කැපවීම මත සහ ඩීසල් යන්ත්‍ර අංශයේ සේවක මහතුන්ගේ කැපවීම මාස 3 ක් වැනි කෙටි කාලයක දී දොඹකරය අලුත්වැඩියා කර යථා තත්ත්වයට පත් කරන ලදී.

මෙහිදී දොඹකර අලුත්වැඩියා අංශයට නන් අයුරින් සහායදුන් ජයබහලු 3/4 සහ බෝයා අංගනයේ වැඩ කළමණාකාර මහතුන් සහ වැඩ අධිකාරි මහතුන් සමග තාක්ෂණික ශිල්පීන් ලබාදුන් සහයෝගය ද අගය කළ යුතුය.

එමගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට රු. මිලියන දෙකකට අධික මුදලක් ඉතිරි කර දීමට හැකි විය.

# දිවංගත පිලිප් ගුණවර්ධන මැතිදුන්ගේ ගුණ සැමරේ





නිදහස් ශ්‍රී ලංකාවක් දිනා ගැනීමට උරදුන්, දේශීය චින්තනයට හා සමාජවාදී දර්ශනයට නායකත්වය දුන් දිවංගත පිලිප් ගුණවර්ධන මැතිදුන්ගේ 46 වැනි ගුණ සමරුව නිමිතිකොටගෙන පුෂ්පෝපහාර දක්වීම වරාය පරිශ්‍රයේදී පසුගිය දා සිදු කරන ලදි.

හාබර් සහ ඩොක් කම්කරු සංගමය විසින් සංවිධානය කරන ලද මෙම පුෂ්පෝපහාර පිදීමේ අවස්ථාවට එක් වූ මහජන එක්සත් පෙරමුණේ නායක හා හාබර් සහ ඩොක් කම්කරු සංගමයේ සභාපති දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සභාව අමතමින්..

නැව්තොටක් වරායක් බවට පත් කිරිමට සහ සේවකයින් හට ආත්ම ගරුත්වයෙන් යුතුව කටයුතු කිරීමට ගෙනගිය අරගලයට කෘතවේදීත්වය දක්වනු වස් දිංවගත පිලිප් ගුණවර්ධන මැතිදුන්ගේ පිළිරුවක් ඉදිකර වාර්ෂිකව සිදු කරනු ලබන ගරු බුහුමන තමා බෙහෙවින් අගය කරන බැව් පැවසීය. තවද කොලොම්තොට වරායක් බවට පත්වීමට අවුරුදු 500 ක් ගත වූ බවත්, වරාය ජනසතු කරන සමයේ එය 120 වැනි ස්ථානයේ පසු වූ බවත් අද දවසේ 23 වැනි ස්ථානය කරා පැමිණීම සමස්ත ශ්‍රී ලංකාවාසීන් හට ම සතුටට පත්විය හැකි කරුණක් බව ද අවධාරණය කරන ලදි.

# රිපිට් අංශයේ මානුෂික මෙහෙවරක්





සන්ධ්‍යා විතාන

පුවත් පතකට ලේ බැංකුව විසින් කරන ලද ඉල්ලීමක් මුල්කර ගනිමින්, නාවික ඉංජිනේරු කොට්ඨාශයේ රිපිට් අංශයේ මෙහෙයවීමෙන් හා මූලිකත්වයෙන් ජාතික රුධිර පාර විලයන මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව සාර්ථක ලෙස ලේ දන්දීමේ කඳවුරක් පසුගියදා පැවැත්විණි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති පී.ජී. දසනායක මහතාගේ ප්‍රධානත්වයෙන් සම්බුද්ධ ජයන්ති චෛත්‍ය පරිශ්‍රයේ දී පැවති මෙම සත්කාරයට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉංජිනේරු කොට්ඨාශය ප්‍රමුඛ සියළු කොට්ඨාශ, අංශ නියෝජනය කරමින් සේවක මහත්ම මහත්මීන් අති විශාල සංඛ්‍යාවක් මේ සඳහා තම මනුසත් භාවය ප්‍රකාශ කරමින් ස්වකීය යුතුකම් ඉටු කිරීමට පෙළ ගැසුන හ.

# කසල නිකසල කරමු

**නිමල් ජයතිස්ස**
**ප්‍රධාන මෙහෙයුම් කළමණාකරු**

ප්‍රි පිවිතුරු හෙටක් තේමා කරගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැලි කසල බැහැර කිරීමේ ක්‍රියාවලිය මනා ක්‍රමවත් ක්‍රියාවලියක් ඔස්සේ ක්‍රියාවට නැංවීමට පියවර ගෙන ඇත.

වරායකින් කසල බැහැර කිරීම කිසිසේත් ලෙහෙසි පහසු කටයුත්තක් නොවනු ඇත. මන්දයත් කාර්යාල, වැඩබිම් පමණක් නොව අංගනයන් හා ඒ ආශ්‍රිත මුහුදු සීමාවේ කැලි කසල ඉවත් කිරීම ද මෙම කටයුත්තට අයත්වන බැවිනි.

අපි ප්‍රථමයෙන්ම වරායේ කාර්යාල ගණයේ කැලිකසල බැහැර කිරීම පිළිබඳ අවධානය යොමු කරමු. මෙහිදී ඉඳුල් සඳහා වෙනම කැලි කසල බඳුනක් ද, ප්ලාස්ටික්/පොලිතීන් සඳහා තවත් කැලි කසල බඳුනක් ද, කඩදාසි සඳහා තවත් කැලි කසල බඳුනක් හා වශයෙන් කැලි කසල වර්ග කිරීමට එකවර හුරුවීම ඔබට තරමක් අපහසු විය හැකිය. සියල්ල එකට ගුලිකොට කැලි කසල බඳුනට දැමීමට හුරුවී සිටි ඔබට මෙය එකවර විකාරයක් සේ දැනුනද අප පුදුම නොවන්නේ ඕනෑම කටයුත්තක සාර්ථකත්වය උදෙසා මහන්සි වීමත්, කැපවීමත් ඉතාමත් අවශ්‍ය හෙයිනි.

තණකොළ ඉබේ වැවුනද, අගනා උඩවැඩියා වර්ගයක් රෝපණයට ඔබ කෙතෙරම් මහන්සි විය යුතුද ? මොහොතක් සිතන්න. කැලි කසල වර්ග කිරීමට ලක් නොකොට ඔබ කසල බඳුනකට දමන්නේ නම් නැවත එම කැලි-කසල තවත් සේවක මහතෙකුට එම කැලි-කසල වර්ග කිරීමට ලක්කිරීමට සිදුවනු ඇත. අද දවසේ ඔබ ඉවත දමන කැලි කසල එකතු වූ පසු තවත් අයෙකු විසින් වර්ගීකරණයට ලක් කිරීමේ දී මුහුණ දෙන්නා වූ අපහසුතාවයන් පිළිබඳ මේ වනතුරු ඔබ නොසිතන්නට ඇත.

වරාය පරිශ්‍රයේ පවතින කැලි කසල බැහැර කිරීමේ දී දැඩි අපහසුතා රැසකට මුහුණ දීමට සිදුවන බව ඔබ දන සිටියා නම් කිසිම දිනක ඔබ කසල බැහැර කිරීමේ කටයුතු වලට සහාය නොදෙන බැව් කිසිසේත් විශ්වාස නොකරමු.

අද දවසේ ශීඝ්‍ර ජනගහන වර්ධනයත් සමග කැලි කසල එකතුවීම නිරන්තරයෙන්ම සිදුවේ. කාර්ය බහුලත්වය සමග ක්ෂණික ආහාරපාන රටා අතර පොලිතීන් භාවිතය උපරිම තලයකට පැමිණ තිබීම මෙම තත්ත්වයට හේතු වී තිබේ.

දිරාපත්වන පොලිතීන්, බත්පත ඔතන පත්තර කොලය, ඉඳුල් වෙන් වෙන්ව දැමීමට අපිට යම් කාලයක් වෙන්කර ගත යුතුය. බුදුන් වහන්සේ වදාළ පරිදි වසලයෙකු හෝ බ්‍රාහ්මණයෙකු වන්නේ ඔහු විසින් කරනා ක්‍රියාකාරකම් අනුවය. යමෙකු ඉඳුල්, බත්, පොලිතීන් සියල්ල වර්ගීකරණයට ලක්නොකර කසල බඳුනට දමන්නේ නම් ඔහු අයිති වන්නේ කවර ගණයට දැයි ඔබට දැන් සිතාගත හැක.

මිනිස් ආත්මයක් ලැබූ ඔබ සුවිශේෂී පුද්ගලයෙකු වීමට ඔබගේ දක්ම ක්‍රියාකලාපය ඉතා වැදගත්ය. අද දවසේ කොළඹ වරායට පැමිණෙන සුවිසල් සංචාරක මගී නෞකා ප්‍රමාණය අතිවිශාලය. ආගන්තුක සත්කාරකත්වයේ පාරාදීසයක් ලෙස බුහුමන් ලැබූ රටක ප්‍රධානතම වරාය කැලි-කසල වලින් පිරී තිබේනම් එම නෞකාවලින් පැමිණෙන මගීන් ලංකාව පිළිබඳ කිනම් ආකාරයේ මතයක් ගොඩනගා ගනීවිද්‍යයි සිතීම ඔබ සුරතේ රැඳී තිබෙන්නෙකි. විශේෂයෙන්ම පිවිතුරු හෙටක් සුන්දර වරායක් තුළ ප්‍රිය දසුන් ඔබ නෙත මෙන්ම සිත ද සන්සුන් කරන අතර ඔබ කරනා සියලු කටයුතු කෙරේ එය සෘජු ලෙස බලපායි.

ඇතැම් අද්දර නැව් තොටවල් කරා පිවිසෙන නෞකා කිසිදු හිතක් පපුවක් නැතිව කසල බැහැර කරනු දැකිය හැකිය. මෙම කසල බැහැර කිරීම ද වරායේ සෞඛ්‍ය පරීක්ෂක තුමා ඇතුළු පිරිස අද දවසේ මුහුණ දෙන්නේ ගැටළුවකි.

කසල බැහැර කිරීම කරා යන ගමනේ ද මුහුණ දෙන්නට, අනේකවිද ගැහැටයන් ට අමතරව ඔබ විසින් ද ගැහැට ඇති කරනු ලබන්නේ නම් එය කිසිසේත් යුක්ති යුක්ත නොවනු ඇත.

''අප බැහැර කරන්නේ කසල වූවත් එය නිසි පරිදි බැහැර කරන්නේනම් එයින් සිදුවන කුසලය නිකසල බව සඳහන් කළ යුතු ම ය.


## වරාය පරිශ්‍රය තුළ
## පොලිතීන් භාවිතයට තිත තැබේ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය උප සභාපති පී.ජී. දසනායක මහතාගේ මග පෙන්වීම යටතේ ඩෙංගු මර්ධන කමිටු නිළධාරීන් සමඟ පැවැති ඩෙංගු මර්ධන රැස්වීමේ දී වරාය පරිශ්‍රය තුළ පොලිතීන් භාවිතය අවම කිරීමට කටයුතු යෙදීම පිළිබඳ සාකච්ඡා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙසින් මාර්තු 01 දා සිට වරාය පරිශ්‍රය තුළට පොලිතීන් ගෙන ඒම හා ආපනශාලා තුළ පොලිතීන් භාවිත කිරීම තහනම් කිරීමට පියවර ගෙන ඇත.

උප සභාපති පී.ජී. දසනායක මහතාගේ මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෛද්‍ය කොට්ඨාශය ප්‍රමුඛ සියළුම කොට්ඨාශ නියෝජනය වන සේ සංවිධානය කළ ඩෙංගු මර්ධන කමිටුව තුළින් මේ සඳහා විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් විවිධ කොට්ඨාශ හා මට්ටමින් පැවැත්වීමට පියවර ගෙන ඇත.

ඒ යටතේ කොට්ඨාශ සහ අංශ මට්ටමින් පොලිතීන් එක් රැස් විය හැකි ස්ථාන අනාවරණය කර ගනිමින් එම ස්ථාන පිරිසිදු කිරීමටත්, ඒ සඳහා සේවක මහත්ම මහත්මීන් දැනුවත් කිරීම හා දැනුම තොරතුරු යාවත්කාලීන කිරීම තුළින් පොලිතීන් භාවිතයෙන් තොර වරායක් ගොඩ නැගීමට පියවර ගෙන ඇත.

විශේෂයෙන් වරාය සේවක මහත්ම මහත්මීන්ගේ පමණක් නොව වරාය භාවිත කරන්නන් හා වාරය තුළ පිහිටි සියළුම ආයතන සේවක මහත්මීන් දැනුවත් කරමින් පොලිතීන් අවභාවිතය පිළිබඳව දැනුවත් කිරීමටත්, අබලි ටයර තැනින් තැන ගොඩ ගැසීම වෙනුවට ඒවා ඉවත් කරන තෙක් නිශ්චිත ගුදම් ගත කිරීමට කටයුතු පවත්වාගෙන යාම, වර්ගීකරණයට ලක් කරමින් කැළි කසල ඉවත් කිරීමේ ක්‍රියාවලිය, ජලය රැඳී ඇති ස්ථාන සොයා බලා එම ස්ථාන ජලය නොරැඳෙන අයුරින් සකස් කිරීම, කාණු සහ ජලය ගලා යන මාර්ග අවහිර නොවන සේ සකස් කිරීම, ආදී ක්‍රියාකාරකම් රැසක් ද මීට සමගාමීව සිදු කෙරේ.



# දකුණු ලකේ ලක් මව බබලන තැල්ල
# ගාලු වරායයි සිරියා දෙන නිල්ල

සටහන
සුභානී නානායක්කාර
(සිවිල් ඉංජිනේරු-ගාල්ල වරාය)

## තතු බිඳක් පළමුව

සංවර්ධන ක්‍රියාවලියක සුභ නිමිති සිතේ දරාගෙන එදා මෙදා තුර ගලා ගිය කාලය අති මහත්ය. ඉවසීම කෙසේ දැඩි වුවත් දන් දන් ගාලු වරාය සඳහා ඇති ඉදිරිය ගැන සැක සිත් පහල වීම වැළැක්වීම උගහටය. එසේ හෙයින් තවමත් ගාලු වරායට ඇලුම් කරන, ගාලු වරාය වෙනුවෙන් දිරිය දරණ සියළුම දෙනාගේ හිතසුව පිණිස වදන් පෙළක් තැබිය යුතු කාලය එළඹ ඇති බව ප්‍රත්‍යක්‍ෂය.

සොබාදම් මැණියගේ මහත් ආශිර්වාදයෙන් වරායක් සඳහාම සුදුසුවන පරිදි රට තුලට නෙරා ගිය හෙක්. 350 ක් පමණ විශාල සමුද්‍ර භූමියක් සහිත මෙම අද්විතීය පිහිටීමෙන් අද ගාලු වරාය ලෙස සිය අයිතිය තුළ රැඳවී ඇත්තේ ගොඩබිමින් හෙක්. 51 ද, සමුද්‍රයෙන් හෙක් 20 ක් ද තරම් වූ කුඩා ප්‍රදේශයක් වන අතර, ඉණුදු ගාලු වරාය ලෙස සැබවින්ම සිය මෙහෙයුම් කටයුතු සඳහා සක්‍රීයව ප්‍රයෝජණයට ගෙන ඇත්තේ මාගාල්ල තුළ පිහිටි ගොඩබිමින් හෙක්. 16.146 ක් වූ ද සමුද්‍රයෙන් දැනට භාවිතා වන හෙක්. 20 ක් වූ ද සුළු වපසරියයි.


ඇත්ත වශයෙන්ම මෙම භාවිතය වරාය අධිකාරිය සතු මුළු ගොඩබිම් ප්‍රමාණයෙන් 31.4% ක් පමණ වන අතර භාවිතා කළ හැකි මුළු සමුද්‍රීය භූමි ප්‍රමාණයෙන් භාවිතා කරන ප්‍රමාණය 5.7 % ක් පමණ වූ ද ප්‍රතිශතයකි.

ඉදින් මෙම විශාල භූමි ප්‍රමාණයක මනා ලෙස ප්‍රයෝජනයට ගත හැකි වන සේ සැකසුණු ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය යළි පණ ගැන්වීමේ භාග්‍යමත් පියවර නව අවුරුද්දත් සමග ඇරඹිය යුතු බව රටේ සමෘද්ධිය උදෙසා කළ යුත්තක්ම ය.

සේද මාවතට ඉතා ආසන්නව දකුණු ලක අගනුවර මනරම් භූමි භාගයක පිහිටා ඇති මෙම ගාලු වරාය 130 m ක පළල පිවිසුම් මාර්ගයකින් ද (Entrance Chanel) 300 m ක දිග හා 200 m ක පළල තරම් වූ සමුද්‍ර තටාකයකින් ද (Sea Basin) යුක්ත වෙයි. ප්‍රධාන ජැටිය වන ක්ලොසන්බර්ග් ජැටිය 423 m පමණ දික් වන අතර 8 m පමණ ගැඹුරින් යුක්තය. විශාල පයිල් බස්සවා කේබල් මගින් ගොඩබිමට ඇද සාදන ලද විශ්මිත ඉංජිනේරුමය නිර්මාණයක් වන මෙම ජැටිය ආචාර්ය කුලසිංහ ඉංජිනේරු මහතා විසින් නිර්මිත අදත් ප්‍රධානතම මෙහෙයුම් සඳහා භාවිතා කරන විශාල ආදායමක් ලබා දෙන පියරයකි. 7.5 m ක පමණ ගැඹුරක් සඳහා නැංගුරම් කළ හැකි මෙහි (Lo A ) දිග 128 m වූ ටොන් 10,000 ඉක්මවන ක්ලින්කර් නැව් මෙහෙයුම් සඳහා දිගින් දිගටම භාවිතා කරයි. මෙබදු නැව් 03 ට පියරය දිගේ නැංගුරම් දැමිය හැකි ලෙස ඉඩකඩ පහසුකම් ඇති මෙම ක්ලොසන්බර්ග් ජැටිය තුළ මුන්ඩායි ගෑස් සමාගමට අයත් නඩුමගට බැසගත් ගෑස් නෞකාව දීර්ඝකාලීනව නවතා දැමීම නිසා ජැටියේ සම්පූර්ණ දිගම මෙහෙයුම් සඳහා යොදාගත නොහැකිවීම ඉමහත් පාඩුවකි.

මෑත කාලයේ සාදන ලද 164 m දිග හා 82 m ක හරස් ජැටියක් ද සහිත නව පියරය (New pier) වරාය ඉංජිනේරුවරයන්ගේ උපදේශකත්වයෙන් චීන සමාගමක් මගින් ඉදිකර ඇති අතර, සමුද්‍ර තටාකය දෙසට 8 m සිට ධීවර වරාය දෙසට 4 m දක්වා වූ වෙනස්වන ගැඹුරකින් යුක්තය. මෙම ජැටිය පයිල් බස්සවන ලද පදනමක් මත ඉදිකර ඇති අතර, නොයෙකුත් පරාසයන්ගෙන් යුත් නෞකා හා යාත්‍රා සඳහා ඉඩ පහසුකම් ලබා දෙයි.

Yacht marina ලෙස මෑතකදී සාදා නිමවන ලද කුඩා රුවල් යාත්‍රාංගනය 3.4 m පමණ ගැඹුරකින් යුතු අතර දැනටත් කුඩා රුවල් යාත්‍රා සඳහා පහසුකම් සපයයි. ඉදිරියේ දී තවදුරටත් ප්‍රවර්ධනය කර භාවිතා කිරීම සඳහා ආයෝජකයන් දිරිමත් කරන අතර ආයෝජකයින් හරහා වඩාත් ගුණාත්මක සේවාවක් ලබාදීමට ද බලාපොරොත්තු වෙයි.



## ලාභ ලැබීම හැරවුම් ලක්‍ෂය 2014


වර්තමානයේ ගාලු වරායේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ INSEE තායිලන්ත සමාගම මගින් ගෙන එන ක්ලින්කර් (Clinker) නැව් මෙහෙයුමයි. පෙර ගාලු වරාය පාඩු ලබන ආයතනයක් බවට පත්ව තිබුණ ද 2014 වර්ෂයේ සිටම ලාභ ලැබීම සඳහා ක්ලින්කර් නැව්වල පැමිණීමේ ප්‍රවර්ධනය සෘජුවම බලපෑ බව නොරහසකි. ත්‍රිකුණාමල වරායට පැමිණෙන මව් යාත්‍රාව වන (Mother vessel) කාංචනා නාරී සිට ලීලා හා සෝබා නමැති සොඳුරු යාත්‍රා දියණියන් (daughter vessels) ඔස්සේ එන මෙම ක්ලින්කර් INSEE ආයතනය (CIAM cement) මගින් නැවකින් නැවකට මාරුකිරීමේ (Ship to ship transfer) පිළිවෙතින් ගෙන එන බැවින් වරායවල් දෙකෙහිම ආදායම් ඉහළ නැංවීමට හේතු වී ඇත. දැනට මසකට ක්ලින්කර් නැව් 6-7 දක්වා ප්‍රමාණයක් පැමිණෙන අතර 2016 වසර සඳහා පැමිණි මුළු යාත්‍රා 162 න් ක්ලින්කර් නැව් ගණන 77කි.

එසේම OPL සේවාවල (Out Port Limit services) වර්ධනයද මේ සඳහා යම්කිසි ප්‍රමාණයක දායකත්වයක් ලබා දී ඇති බව කිව යුතුමය. OPL සේවාව යනු මුහුදු මංකොල්ලයන් බහුල මුහුදු සීමා කලාප හරහා යන නැව් සඳහා ආරක්ෂිත සේවා කණ්ඩායමක් OPL යාත්‍රා මගින් ඈත මුහුදේ දී ලබා දීමත් එම මුහුදු මංකොල්ලයන් බහුල කලාප පසුකර පැමිණෙන නැව්වලට එම ආරක්ෂිත සේවාව දී අවසන් බැවින් නැවත OPL යාත්‍රා මගින් ආරක්ෂිත කණ්ඩායම් ගොඩබිමට ගෙන ඒමත් ය.

2014 වර්ෂයේ දී මෙම OPL services ගණනද 11,461 ක උපරිමයකට පැමිණ ඇති අතර, එය ඉන්පසු ක්‍රමක්‍රමයෙන් අඩුවී ඇති බව පෙනී යයි. මෑත ඉතිහාසයේ 2008 න් පසු ගාලු වරායේ ආදායම් වියදම් සැසඳීමේ දී 2008 වසරේ දී ලැබුණු මුළු ආදායම රු. මිලියන 314 කි. ගෙන්වන ලද කාගෝ ප්‍රමාණය ටොන් 394,802 ක් වන අතර, පැමිණෙන ලද මුළු නැව් හා යාත්‍රා ප්‍රමාණය 35 කි. මුළු ලාභ අලාභ සැසඳීමේ දී 2008 වර්ෂයේ දී ලබා ඇති මුළු අලාභය රු. මිලියන 278 කි. 2014 වසරේ දී වසර ගණනාවකට පසුව ලැබූ පළමු ලාභය රු. මිලියන 95 ක් වන අතර, මෙහෙයුම් කරන ලද කාගෝ ප්‍රමාණය 393,977 කි. පැමිණෙන ලද මුළු නැව් ප්‍රමාණය 45 කි. ගාලු වරායේ කාගෝ ප්‍රමාණය 2014 දී දී සුළු ප්‍රමාණයක (ටොන් 825) අඩුවීමක් පෙන්නුම් කළත් පැමිණෙන මුළු යාත්‍රා ප්‍රමාණයේ වැඩිවීමත් OPL Services වල වැඩිවීම උපරිම වීමත් මෙහෙයුම් Tarrif වල කරන ලද වෙනස්කම් යන නොයෙකුත් සාධක හේතු කොට ගෙන ලාභ ලැබීමේ හැරවුම් ලක්‍ෂයක් වෙත 2014 වසරේ දී පැමිණ ඇති බව හෙළිදරව් කරමි. 2016 වසර තුලදී පෙන්වන මුළු ආදායම රු. මිලියන 1239 ක් වන අතර ලබන ලද ශුද්ධ ලාභය රු මිලියන 497 ඉක්මවන්නේ ගෙනෙන ලද මුළු කාගෝ ප්‍රමාණය ද ටොන් 762, 286 ක් දක්වා ද වර්ධනය වීමත් පැමිණෙන ලද මුළු යාත්‍රා ප්‍රමාණය 83 ක් දක්වා වැඩිවීමත් සමඟින් වන බව පවසන්නේ ඉමහත් සතුටකිනි. 2016 වසරේ දී වරාය ලද ශුද්ධ ලාභය 2014 වසර හා සසඳන විට පස් ගුණයකටත් වඩා වැඩි වන අතර එය 2015 වසර හා සසඳන විට තුන් ගුණයකට වඩා වැඩිය.

ඉදින් මෙම මෙහෙයුම් හා පහසුකම් සැපයීම සඳහා ඇප කැප වෙන ගාලු වරායේ සියළු අංශවල ශ්‍රමාභිමානී සේවක මහතුන් සඳහා ද ප්‍රශංසා ශීර්ෂ ප්‍රණාමයක් ලබා දිය යුතු බව කිව යුතුමය.

මතු සම්බන්ධයි...



# What's happening around us ?

## A brief on:
## IOR, Kra project, Sagar Mala/ Sethu Samudram, C-PEC, C-MEC, OBOR (BRI)

Since ancient times, Sri Lanka has been identified by the global travellers as a geostrategic hub. They were from every part of the world. Even in modern times, Sri Lankan governments from time to time has promoted Sri Lanka as a hub. It sound most related to the "Maritime". Sri Lanka is adjacent to the busiest shipping lines of the world.

In ancient libraries of Alexandria, the island was called Taprobone. The Greek - Egyptian cartographer, Ptolemy, elongated Sri Lanka on his map due to its rich civilization and trade relations with the rest of the world. The information of this rich civilization and the facts of trade relations, prosperity, and geostrategic location were conveyed by these travellers, sailors, to all over the world. Therefore the people of Africa, Persia, China, India, Japan, Rome and Greeks were well known of this Island.

Further of geostrategic location of Sri Lanka, it has been attracted by the most of nations in the globe. Therefore, from time to time this island has been invaded by several nations.

Sri lanka is surrounded by the Indian ocean. Indian Ocean Region - "IOR" is covered up approximately 20 percent of the water of the earth's surface of 70,560,000 sqkm and it is surrounded by the land masses of Africa, Asia, and Oceania. There exsist several choke points such as the strait of Malacca, the Palk strait and the strait of Hormus.




Why the world is concerned about IOR? And what is the importance of IOR?

According to the Harsh V, Pant, "The great game of this century will be played on water of the Indian Ocean. " What is this concept? It has included the fact of the land masses surrounding the region that are densely populated with over 2 billion people. Therefor, the concept of IOR has included some ideas of geo-logistics, geopolitical, geo-economics and geo-social importance to strengthen the importance of the IOR. According to the statement of Alfred Mahan, an expert of 'Blue Economy' "Whoever controls the Indian Ocean dominate Asia, the destiny of the world will be decided on its waters."

The region of Indian Ocean: 14.6 % of the world's fish stock is caught in this region. 64% of the oil trade-travel through the entry ways into and out of the Indian ocean and around 36 million barrels per day, equivalent to about 40% of the world oil supply use this way. This is the second largest maritime route in the world. The way has been attracted by the world container transportation a highest percentage as well as cruise lines.

On the other hand the world Economic power is transforming to China from west. At Present, the economic growth rate of China remains with a two digits number and India is also becoming a powerfull nation in world with its economic and logistics power.

Because of these reasons, IOR has become as the busiest maritime region in the world. As a result of this transformation, many kinds of elements are streaming constantly consisting with crude Oil, row materials, finished products, labour, etc., for the wants of industrialization of sister countries in IOR and away from the IOR.

At present, this situation has been the evolution to a conflict of globe, among the world maritime entrepreneur, to get a great portion through this trade.

Therefore, several IOR countries are getting appropriate initiatives to keep up a sustainable atmosphere within their countries and protect their national aspirations and developments strategies from the effectives of the above conflicts.

Sagar Mala & Sethusamudram , a project of the Indian government, has been implemented with the intention of port development and to create an easy access channel through the Palk strait to transport their products and goods.

In collaboration with China, Thailand has introduced a plan to excavate a marine channel across the Malayan peninsula through the land belongs to Thailand, namely the Kra channel. It will facilitate an access to bypass the Strait of Malacca and Singapore, reducing thousands of miles for the ship lines and space will be provided to reach to Pacific Ocean or Indian Ocean, just like Panama or Suez channels.

The C-PEC (China Pakistan Economic corridor), is a project of Pakistan, that goes with a Chinese collaboration. It has introduced as the "BRI" project of China. This project has undergone with the concept of 'Silk road economic belt', which is the new name given to the ancient 'silk route'. This belt will consist of one railway corridor from the central China, and other from the northern China to Europe via Russia; and a non - rail corridor from Wester Chain, through Central Asia to Iran, the Levant and Turkey proceeding southward to the port of Gawadar at Baluchistan in Pakistan through the Pakistan administrated Kashmir.

Myanmar, situated in Malayan peninsula, has introduced the "C-MEC - China Myanmar economic corridor" .The belt will begin from the Yunnan province in China to the port of "Kyauk phyu" in Myanmar, involving railways, Motorways, oil and gas pipelines.

The OBOR (One Belt - One Road), also known as the BRI (Belt and the Road Initiative), was launched by China in 2013 with the view of "String of Pearls - Port". It has focused to construct a link of ports as a string of pearls with the assistance of China especially in IOR.

With the rapid developments of China, the country has under gone a long term struggle, to bring row materials and energetic resources to the industrial zones all over the country. This challenge has affected dynamic development process.

Therefore, China is looking forward to motivate its supply chain with the assistance of neighbour countries. Accordingly, China has made some bilateral dialogs with those countries to develop their ports and provide facilities to enrich their national aspiration.

**Kawya Indrajith**

# හමු වී හමුවීමක්

පසුගිය දිනයක වරාය අධිකාරියේ එක්තරා කොට්ඨාශයක පැවති උත්සව අවස්ථාවක සුන්දර කතා අතරේ මේ වගේ කතාවක් ඇසුණා. එක් පුද්ගල කොටසක් හමුවී හමුවෙනවලු. තවත් කොටසක් හමු නොවී හමුවෙනවලු. තවත් කොටසක් හමුනොවී හමුනොවෙනවලු. හමුවී හමුවෙනවා කියන්නේ යම් පුද්ගලයෙක් එක අවස්ථාවක හමුවෙලා ඔහු හැමදාමත් මතකයේ රැදෙන යමක් තබලා ගියාම ඇතිවන තත්ත්වයයි. ළඟදි දවසක මේ ලිපිය ලියන ලේඛිකාවගේ රාජකාරී මේසය ඉදිරිපිට උගත් මහතෙක් වාඩි වෙනවා. දීර්ඝ කතාවක් (මොකද පැය 08 ක සේවා කාලය තුල පැය 1/2 ක් කියන්නේ ලොකු වෙලාවක්) දේශනාව මට එල්ල වුනාට කාටත් වැදගත් දේශනයක්. කිවු දේ ගෙඩි පිටින් නොලියා වෙනත් විදිහකට මම ඔබට ලියන්නම්. ලියන්නේ පැන්සලක් ගැනයි. මේ පැන්සල ජීවිතය ගැන අපූරු පාඩමක් කියා දෙනවා.

ඔප මට්ටම් කළ ලීයක් පැන්සලක් වුණේ එහි මැදට මිනිරන් කූරක් දාපු නිසයි. ඒ කියන්නේ පැන්සලේ වටිනාම කොටස තියෙන්නේ අභ්‍යන්තරයේ. මේ මිනිරන් කූර නැතිනම් එය තව දුරටත් පැන්සලක් බවට පත්වෙන්නේ නෑ. පැන්සලෙන් වැඩක් ගන්න නම් (අකුරු ලියන්න නම්) මේ ඇතුලේ තියෙන මිනිරන් කූර එළියට ගන්න ඕන.

පැන්සලත් අපේ ජීවිතය වගේ, මොකද එහෙම කියන්නේ අප සතු වස්තුව, දේපල, මිල මුදල්, රූසපුව මේ ආදී දේ පැන්සලේ මේ පිටතින් පේන ලී කවරය වගේ අපිව ලස්සන කරනවා. වෙන අයගේ ආකර්ශණය ලැබෙනවා. නමුත්, අපේ ඇතුළත තියෙන ගුණධර්ම, ධෛර්යය, ආත්ම විශ්වාසය, උත්සාහය, මනුසත්කම වගේ දේවල් වලින් අපිව කවුද කියන එක තීරණය වෙනවා. පැන්සලෙන් වැඩක් ගන්න මිනිරන් කූර එළියට ගන්න වෙනවා වගේ අපේ අභ්‍යන්තරයේ මේ නොපෙනෙන ගුණධර්ම, උත්සාහය, මනුස්සකම ආදිය එළියට ගැනීමෙන් මිනිසුන් විදියට ඉපදිලා අපට පුළුවන් වෙනවා මිනිසුන් වෙනුවෙන් වැඩක් කරන්න. තමාගේත්, සමාජයේත් යහපත වෙනුවෙන් එළියට ගත යුතු මේ සැඟවු අභ්‍යන්තරය එළියට ගැනීමයි වැදගත්.

පැන්සලෙන් වැඩගන්න පැන්සල උල් කරන්නම ඕන. පැන්සලට කථා කරන්න පුළුවන්නම් කියයි මේ උල් කිරීමේ ක්‍රියාදාමය කෙතරම් අමිහිරි ද, වේදනාකාරි ද කියලා. අපටත් අපගේ ජීවිතයේ වැදගත්ම දේ මතු කර ගන්න නම් මේ වේදනාකාරී ක්‍රියාදාමයට මුහුණ දෙන්න සිදුවෙනවා. පැන්සලෙන් වැඩ ගන්න වැඩ ගන්න තුඩ කැඩෙනවා, ගෙවෙනවා. යළිත් උල් කරනවා. පැන්සල කොට වෙනවා හැබැයි මෙහෙම වෙනවා කියලා පැන්සල උල් නොකර තිබ්බොත් පැන්සලෙන් කාටවත් වැඩක් වෙන්නේ නෑ.

අප ලඟ තිබෙන වටිනාම දෙය මතුකර ගන්න නම් අපටත් මෙවැනි වේදනාකාරී දේවලට මුහුණ දෙන්න වෙනවා. එක දිගට වැඩ කරන්න වෙනවා. පුහුණුවීම් වල යෙදෙන්න වෙනවා වෙනත් වැදගත් දේ මගහරිමින් කාලය යොදවන්න වෙනවා. ඒ විතරක් ද කැපිලි කෙටිලි, කකුලෙන් ඇදිලි එමටයි. මෙවැනි වේදනාකාරී ක්‍රියාවලට අපට අනිවාර්යයෙන් මුහුණ දිය යුතු වෙනවා. වේදනාවයි කියලා මේ ක්‍රියාවලියට අප මුහුණ නොදුන්නොත් අපිත් අර උල් නොකරපු පැන්සල වගේ කිසි වැඩකට නැති කෙනෙක් බවට පත්වෙනවා. සියලු බාධාවන් මධ්‍යයේ මේ දුෂ්කර ගමන යාමෙන් පමණයි ජීවිතේ යහපත් වෙනසක් ඇතිකර ගන්න පුළුවන් වෙන්නේ.

'කුස්සියේ උයන කෙනා අතිනුයි වළං බිදෙන්නේ' එහෙම කියමනක් තියන්නේ හැමදාම වැරදුණේ වැඩ කරන අපටම නිසයි. මේ කරන වැඩේ ලියන වැඩක් නම් ලීවේ පැන්සලෙන් නම් වැරදුනත් බයවෙන්න දෙයක් නෑ. ඒ ඇයි පැන්සලේ පිටුපස තිබෙන මකන කෑල්ලෙන් වැරදි දේ මකලා දමලා නිවැරදි දේ ලියන්න පුළුවන්. වැදගත්ම දේ ලියුවේ ලියයුතු දේද නොලියුතු දේද කියන කාරණය අවබෝධ කර ගැනීම මෙහිදි වැදගත් වෙනවා.



අපේ ජීවිතයයි පැන්සලයි ආයෙත් සමාන වෙනවා. ඉහත කාරණයේ දී පැන්සලට වගේම අපටත් පුළුවන් වරදක් වූ විට එය නිවැරදි කර ගන්න. වැරදියි කියන බියෙන් මොකුත් නොකර ඉන්නවට වඩා වැරැද්දට මුහුණ දීම හා එය නිවැරදි කර ගැනීමේ ආත්ම විශ්වාසයයි ජීවිතයට වැදගත්. ඒ නිසා අපිත් අපේ හීන වලට යන ගමන යමු. පය පැකිලේවි, ඇද වැටේවි නමුත් පැන්සලත් වගේ වැරදි නිවැරදි කරගෙන ඉදිරියට යමු. එයින් ලැබෙන ප්‍රතිඵලය ජයග්‍රහණය ම වේවි.

පැන්සලෙන් ලියනවිට පැන්සලට බාහිරින් ප්‍රමාණය ඉක්මවා බරක් දුන්නොත් පැන්සලේ තුඩ විනාශ වෙනවා. ඒක අපි කවුරුත් අත්දැකපු දෙයක්. අපේ ජීවිත වලටත් පිටතින් යෙදෙන දැඩි පීඩනයට අප දක්වන ප්‍රතිචාරය අනුවයි අපි කරදරේ වැටෙනවද නොවැටෙනවද කියලා තීරණය වෙන්නේ. සමහර අය අපට යම් යම් වැඩ පවරනවා. විවිධ උදව් ඉල්ලනවා. නමුත්, අපේ හැකියාව, කාලය, සම්පත් ආදි විවිධ කාරණා අනුව සලකලයි මේ බාහිරින් එන පීඩනය භාරගන්න ඕනෑ. අපට බාහිරින් එන පීඩනයන් හසුරුවා නොගතහොත් එහෙම නැතිනම් නැහැ බැහැ කියන්න පුරුදු නොවුනොත් පැන්සල තුඩ වගේ අපි කැඩිලා බිදිලා යන්නත් පුළුවන්.

**- සී.ඩී හෙට්ටිආරච්චි -**

# බහලුවක වගතුග

**1 දිගහැරුම**

**ප්‍රධාන වශයෙන් කොළඹ වරායට පැමිණෙන නැව් වර්ග තුනකට බෙදිය හැක.**

1. සම්ප්‍රදායික නැව්බඩු රැගෙන පැමිණෙන නැව්
2. වාහන රැගෙන පැමිණෙන නැව්
3. බහලු රැගෙන පැමිණෙන නැව්

සාම්ප්‍රදායික නැව්බඩු ලෙස සැලකෙන සිමෙන්ති, සීනි, පිටි, පොහොර, නොයෙක් යන්ත්‍ර සූත්‍ර (ප්‍රොජෙක්ට් කාගෝ) ලී, යකඩ, වැනි භාණ්ඩ රැගත් නැව් වලින් භාණ්ඩ නිෂ්කාශණය කිරීමේ දී කෙලින්ම නැවේ සිට ලොරියට බඩු පැටවීම සිදුකරන අතර, ඒ සඳහා වරායට අයවිය යුතු ගාස්තු නිසි ලෙස ගෙවා ඇත්නම් රේගු අවසරය ද ලැබී ඇත්නම් ඒවා පරික්ෂාකර බලා අයිතිකරුවන්ට භාණ්ඩ රැගෙන යාමට අවසර පත්‍ර නිකුත් කරනු ලබන්නේ සේවා සැපයුම් කොට්ඨාශය මගිනි. එසේම එසේ රැගෙන එන භාණ්ඩ කෙලින්ම ලොරි වලට පටවා රැගෙන නොයන්නේ නම් එම භාණ්ඩ අංගනයේ හෝ ගබඩාවේ තැන්පත් කිරීම සඳහා පහසුකම් සැපයීම මෙම කොට්ඨාශයේ වගකීමයි. එසේ ගොඩබාන භාණ්ඩ අයිතිකරුවන් රැගෙන යනතුරු සේවා සැපයුම් කොට්ඨාශයේ ගුදම් කාර්ය මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පවතී.

එසේම වාහන රැගෙන පැමිණෙන නැව් වලට ද වාහන ගොඩබෑම සඳහා අංගන පහසුකම් සැපයීම සේවා සැපයුම් කොට්ඨාශයේ වගකීමයි. නැව් වලින් අංගනයට ගොඩබාන වාහන අයිතිකරුවන් රැගෙන යනතුරු ගුදම් කාර්ය මණ්ඩලයේ අධීක්ෂණයේ පවතින අතර, අයිතිකරුවන් රැගෙන යාමට පැමිණි විට ගේට්ටු අවසර පත්‍ර නිකුත් කිරීම සේවා සැපයුම් කොට්ඨාශයේ ගුදම් කාර්ය මණ්ඩලය මගින් සිදු කරයි.

බහලු රැගත් නැව්වලින් රැගෙන යන භාණ්ඩ ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදිය හැක.

1. FCL බහළු (තනි අයිතිකරුවකුගේ භාණ්ඩ රැගත් බහළු)
2. LCL බහළු (අයිතිකරුවන් කිහිප දෙනෙකුගේ භාණ්ඩ රැගත් බහළු)
3. ප්‍රති අපනයන භාණ්ඩ රැගත් බහළු

මෙහිදී FCL බහළු හා LCL බහළු සඳහා සේවා සැපයුම් කොට්ඨාශය මැදිහත්වන අතර ප්‍රතිඅපනයන රැගත් බහළු සඳහා කෙලින්ම සම්බන්ධ නොවේ. FCL බහළු නිෂ්කාෂණයට පැමිණි විට ඒ සඳහා රේගු අනුමැතිය හා වරාය ගාස්තු නිවැරදිව ගෙවා ඇත්නම් ලියවිලි නිවැරදිව ඇත්නම් ඒවා පරික්ෂාකර බලා වරායෙන් පිටතට රැගෙන යාමට අවසර පත්‍ර නිකුත් කිරීම සේවා සැපයුම් කොට්ඨාශය සිදු කරනු ලබයි. LCI බහළු වරායේ ඇති මෙම කොට්ඨාශයේ ගබඩාතුළ ගොඩබානු ලබයි. එසේ ගොඩබෑමේ දී බහලු තුළ ඇති භාණ්ඩවල වර්ගය අනුව ඒ සඳහා වෙන් කොට ඇති ගුදම් තුළ ගොඩබෑමට කොට්ඨාශයේ නිලධාරීන් කටයුතු කරයි.



# තුරුණු සිත් එකළු කළ
# නිපොන්මාරු (NIPPONMARU)

නැවිතොටක් වෙත නෞකාවක් පැමිණීම අරුමයක් නොවුන ද, විශේෂ අරමුණකින් පෙරදැරිව ලොව වටා සංචාරය කරන නෞකාවක ආගමනය විස්මය ජනකය. එවන් නැවක් පසුගියදා කොළඹ වරායට පැමිණියේ මෙරට තරුණ දූ පුතුන් 12 ක් ද සමගින් තරුණ නායකත්වය, සංස්කෘතික සබඳතා පෙරදැරිව ලොව වටා සංචාරයක යෙදෙන අතරතුරය.

ජපන් රජයේ අගමැති කාර්යාලය මගින් සංවිධානය කරන ජපන් තරුණ නෞකා වැඩසටහන යටතේ වාර්ෂිකව ක්‍රියාත්මක කෙරෙන, නෞකා සංචාරයේ නිරත ''නිපොන් මාරු'' මිත්‍රත්ව තරුණ නෞකාව 1980 වසරේ ස්වකීය සමාජ මෙහෙවර ආරම්භ කරන ලදී. ලෝකයේ තරුණ තරුණියන් අතර සංස්කෘතික, සමාජීය හා දේශපාලනික අවබෝධයක් ඇතිකර ගැනීමත්, අන්‍යොන්‍ය අවබෝධය ගොඩනගා ගැනීම හා ඔවුන් තුළ නායකත්වය කුසලතා වර්ධනය කර ගැනීමට ද මෙම නෞකා සංචාරයන් අපේක්ෂිත මෙම ලෝක තරුණ නෞකා වැඩසටහන යටතේ සංචාරය කිරීමට ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 11 ක තරුණ තරුණියන් 242 දෙනෙකු සහභාගී වී සිටින අතර ජපානය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, මෙක්සිකෝව, මොසැම්බික්, ඕමානය, පේරු, පෝලන්තය, දකුණු අප්‍රිකාව, ස්පාඤ්ඤය යන රටවල් ඊට අයත්වේ. මෙවර සංචාරය තුළ දින 45 ක් පුරා ලොව තරුණ තරුණියන් වෙත තම රට ජාතිය සංස්කෘතිය ලෝකය හමුවේ ලෙනහැර දැක්වීමට අවකාශය ලැබුණි.

1980 දශකයේ සිට මෙම නිපොන්මාරු සංචාරයට සහභාගී වූ ශ්‍රී ලාංකිකයන් 194 දෙනෙකු සිටින අතර ඉන් එක් අයෙකු ඔබ අප කවුරුත් දන්නා වරායේ අපේ නිලධාරියෙකු වීම ද අප සැමට ආඩම්බර විය හැකි කරුණකි. ඔහු මහපොළ සමුද්‍රීය විද්‍යායතනයේ ප්‍රධාන පුහුණු කළමණාකරු සරත් දයානන්ද මහතායි. ඔහු ලෝක තරුණ නෞකා නායක සම්මේලනයේ ශ්‍රී ලාංකික මහලේකම්වරයා ලෙස ද කටයුතු කරයි. එතුමා නිපොන්මාරු පිළිබඳ සුන්දර යටගියාව සිහිපත් කළේ මෙලෙසයි.

''නිපොන්මාරු නෞකාවේ සංචාරය තුළ ශ්‍රී ලංකාව නියෝජනය කරන්නට ලැබීම මගේ ජීවිතයේ ලැබූ සුවිශේෂි අවස්ථාවක් හැටියට මං සලකනවා. ලෝකයේ විවිධ රටවලින් පැමිණි තරුණ පිරිසක් සමගින් සංස්කෘතික කලාත්මක, බැඳියාවන් තහවුරු කිරීමටත්, ශ්‍රී ලංකාව සතු සුවිශේෂි ලක්ෂණ ලෝකය හමුවේ ගෙනහැර දැක්වීමටත් එහිදී මම ඇතුළු කණ්ඩායමට අවකාශය ලැබුණා. එවකට මා සරසවි අධ්‍යාපනය අවසන් කළ තරුණයෙක්. අද දවසේ නැවත වරක් නිපෝන්මාරු නෞකාව දැකීම එහි මා නවාතැන් ගෙන සිටි කාමරය, රටරටවල් නියෝජනය කළ මිතුරු කැළ සියල්ල පිළිබඳ අභිමානයක් මේ මොහොතේ මගේ හිතට දැනෙනවා. මා ගිය නිපොන් මාරු සංචාරයේ දී ජපානය, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව, ඕමාන, ස්විස් ඇල හරහා ඊජිප්තුව, ස්පාඤ්ඤය හරහා ඉතාලියේ සංචාරය කළා. මෙම සංචාරයේ දී පළමුව ජපානයේ අගමැති කාර්යාලයේ සේවා පුහුණුවක් සපයන අතර පසුව ජපන් නිවසක සති දෙකක නේවාසිකව ගත කිරීමෙන් මහගු අවස්ථාවක් හිමිවේ. අනතුරුව නිපොන් මාරු නෞකාවේ නේවාසිකව සිටිමින් මෙම සංචාරයේ දී ලෝක සංස්කෘතිකමය හුවමාරු සබඳතා, ක්‍රීඩා නායකත්වය, දේශපාලන, සමාජීය කරුණු පිළිබඳව කණ්ඩායම් දේශන සම්මන්ත්‍රණ පැවැත් වේ. එමෙන්ම දින වෙන් කරමින් රට රටවල ජාතික උත්සව විශේෂ සංස්කෘතික වැඩසටහන් අධ්‍යයනය සහ දායකත්වය ලබා දෙයි. මෙහි දී සහභාගි වන සැම තරුණ තරුණියකටම ඔහුගේ විෂයන්ට අදාලව දේශන පැවැත් වීමට සිදු වනු ඇත.


> නිපොන්මාරු නෞකාවේ සංචාරය තුළ ශ්‍රී ලංකාව නියෝජනය කරන්නට ලැබීම මගේ ජීවිතයේ ලැබූ සුවිශේෂි අවස්ථාවක් හැටියට මං සලකනවා. ලෝකයේ විවිධ රටවලින් පැමිණි තරුණ පිරිසක් සමගින් සංස්කෘතික කලාත්මක, බැඳියාවන් තහවුරු කිරීමටත්, ශ්‍රී ලංකාව සතු සුවිශේෂි ලක්ෂණ ලෝකය හමුවේ ගෙනහැර දැක්වීමටත් එහිදී මම ඇතුළු කණ්ඩායමට අවකාශය ලැබුණා.










ආරම්භයේ දී එක් රටකින් 20 ක පමණ කණ්ඩායමක් බැගින් සහභාගී කරවාගෙන රටවල් 6 කට පමණ කෙරෙන සංචාරයක් ලෙස ක්‍රියාත්මක වූ මෙම සංචාරය මේ වන විට එක් රටකින් 12 දෙනෙකුගෙන් කණ්ඩායමක් ලෙසින් රටවල් දෙකක සංචාරයක් බවට පත්ව ඇත. සංචාරයට සහභාගි වන එක් අයෙකු වෙනුවෙන් ජපන් රජය ලක්ෂ 35 පමණ මුදලක් වැය කිරීම ද සුවිශේෂි කරුණකි.

මෙවර සංචාරයේ දී සහභාගී වූ තරුණ තරුණියන් හට කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන චාරිකාවකට ද සහභාගී වීමට ද අවස්ථාව සැලසුණි. එමෙන්ම ජාතික තරුණසේවා සභාව, නාවින්න ආයුර්වේද මධ්‍යස්ථානය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආදී ස්ථානයන් ද මෙවර නිපෝන් මාරු ශ්‍රී ලාංකීය සංචාරයේ දී අවධානයට පාත්‍ර විය. එමෙන්ම ශ්‍රී ලංකාවේ විවිධ සංස්කෘතිකාංග කැටි කර ගත් ශ්‍රී ලංකා රාත්‍රිය නිපොන් මාරු චාරිකාවේ සැමට වෙසෙස් මතකයන් එක් කරනු නොඅනුමානය.

තීර්ථ

# කොළඹ වරාය ප්‍රවර්ධන

## ප්‍රධාන පර්යන්ත ත්‍රිත්වය සාමූහික




ලෝකයේ වරාය වර්ගීකරණයේ දී 23 වන ස්ථානය හිමිකරගත් කොළඹ වරාය තවදුරටත් සංවර්ධනය කිරීමේ අරමුණින් කොළඹ වරාය තුළ ක්‍රියාත්මක ප්‍රධාන පර්යන්ත ත්‍රිත්වය වන J.C.T., C.I.C.T. සහ S.A.G.T. යන පර්යන්ත සමග සාමූහික ගිවිසුමට අත්සන් කිරීම වරාය හා නාවික අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පසුගියදා සිදු කෙරිණි. ගිවිසුම්ගත වීමට පෙර S.A.G.T. පර්යන්ත පෞද්ගලික රාජ්‍ය හවුල් ගිවිසුම් මත වෙන් වෙන්ව කටයුතු කරන ලදී.

මෙම සාමූහික ගිවිසුම අනුව පර්යන්ත ත්‍රිත්වයට මින් ඉදිරියට සාමූහිකව බහලු මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය තව දුරටත් වර්ධනය කර ගැනීම මගින් කාර්යක්ෂම සේවාවක් ලබාදීම මූලික කර ගනිමින් මෙම ගිවිසුම් ගතවීම සිදුවිය.

මෙහිදී අදහස් දක්වූ වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා, කොළඹ වරාය තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන පර්යන්ත තුන එක් කරන්නට හැකිවීම පිලිබඳ තමා දැඩි සතුටට පත්වන බවත්, මින් කොළඹ වරාය ජාත්‍යන්තරයට ගෙනගොස් ප්‍රචලිත කරන්නට මේ නිසා හැකිවන බවත් පැවසීය.

තවද, මෙමගින් පාර්ශවයන් ත්‍රිත්වයටම ප්‍රතිලාභ අත්වෙන බවත් පැවසීය. එහිදි අමාත්‍යවරයා මෙසේ ද පැවසීය.


''විශේෂයෙන්ම අපේ රටේ ආර්ථිකය මින් අත්වන ශක්තිය විශාලයි. ඒ වෙනුවෙන් වරාය අධිකාරියේ සභාපතිතුමා ඇතුළු පිරිස මෙම තීරණයට එළඹිලා තිබෙන්නේ. මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව විශේෂ වැඩසටහනක් කොළඹ වරායේ උන්නතිය වෙනුවෙන් සිදුකරන්නටත් අපේ බලාපොරොත්තුවක් තිබෙනවා.

කොළඹ වරාය හවුල්කාර SAGT පර්යන්තය හරහා කෙරෙන ගනුදෙනු දිහා බලපුහාම බහලුම් මිලියන 1.8 ක් 2017 දී ඔවුන් වාර්ථා කරලා තිබෙනවා. CICT පර්යන්තය මේ වන විට විටින් විට ආයෝජනය කිරීම තුළින් මිලියන 600 ක් පමණ ආයෝජනය කර තිබෙනවා. CICT පර්යන්තයට මේ වන විට බහලු මිලියන 2.4 කට ආසන්න මෙන්ම බහලු ප්‍රමානයක් සිදුකරලා තිබෙනවා. මේ පර්යන්තය අද විශාල වශයෙන් දියුණු වෙලා මෙම පර්යන්ත තුනේම වර්ධනයක් අපට පෙනෙන්නට තිබෙනවා. 2017 අග වෙනකොට කොළඹ වරාය බහළුම් මිලියන 06 ක් සිදුකරලා තිබෙනවා. මේ අවුරුද්ද අවසානය වෙන කොට බහලු මිලියන 07 දක්වා වැඩිකර ගැනීමට අපි උත්සාහ දරනවා. දැන් අලුත් නැව් අපේ රටට එනවා. අලුත් නැව් සමාගම් අපේ රටට එන්න පටන් අරන් තිබෙනවා. මේ ගිවිසුමක් සමග අපි ආරම්භ කරන ජාත්‍යන්තර වැඩපිළිවෙළ හරහා තවත් නැව් සමාගම් අපත් සමග ඉදිරියේ දී එකතු වේවි.

JCT පර්යන්තයක් පුළුල් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා කැබිනට් අනුමැතියක් මට ලැබී තිබෙනවා. ඒ වගේම ඒ සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදුකර තිබෙනවා. කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ වැඩ කටයුතුත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය හරහා සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. මේ නිසා ඉදිරියේ දි කොළඹ නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්නට හැකි වෙනවා. ඒ වගේම මෙම කටයුතු හරිත ක්‍රමයකට සිදුකිරීමට අපි බලාපොරොත්තු වෙනවා. පරිසර ඇමතිවරයා හැටියට ජනාධිපතිවරයා එසේ කරන්නට මට උපදෙස් ලබා දී තිබෙනවා.

මෙහෙයුම් සිදු කිරීමේ දී මෙන්ම කටයුතු







# යට
# ගිවිසුමකට









කිරීම හේතුවෙන් ඒ ඒ පර්යන්ත නමට ලියාපදිංචි ජාත්‍යන්තර වරායවල බහලු නෞකා අදාල පර්යන්තවල ඉඩ ලැබෙන තෙක් පිටත නවත්වා තැබීමට සිදුවෙනවා. ගිවිසුම් ගතවීමෙන් පසු ඉඩ ඇති අනෙකුත් පර්යන්තයකින් මෙහෙයුම් සිදු කිරීමට අවස්ථාව ලබා දීමේ හැකියාව හිමි වෙනවා. ඒ අනුව බහලු මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වාගෙන යාමටත් හැකියි.

අන්තර් ජාතික නව නැව් සමාගම් ද මේ වන විට කොළඹ වරායේ සේවය ලබා ගැනීමට ඉදිරිපත් වෙමින් තිබෙනවා. ඒ අනුව දේශීය ව්‍යාපාරික කණ්ඩායම් සාමූහිකව කටයුතු කිරීමේ සංස්කෘතියකට පෙළඹී සිටිනවා. වරාය අධිකාරියේ මැදිහත්වීමත් සමග නව නැව් සමාගම් ගෙන්වා ගැනීමේ හැකියාව තවදුරටත් වැඩි කර ගැනීමට අවස්ථාව උදාකර ගන්නට පුළුවන්.

මේ වන විට හම්බන්තොට කර්මාන්ත පුරවරයක් හරහා ක්‍රියාත්මක වෙනවා. කොළඹ වරාය හා මේ වරායෙන් සිදුවන සේවා දෙයාකාර නිසා තරඟකාරීත්වයක් ඇති වීමට හේතුවක් නැහැ. මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා අදහස් දක්වමින් ''මේ ගිවිසුම මත සේවා බෙදාගෙන කිරීම සිදුවූවත් ඒ සඳහා මිළ ගණන් කෙසේ බෙදා වෙන් කෙරෙනවාද යන්න තීරණය කර නැහැ. ඒ සඳහා ද ගිවිසුම් ගතවිය යුතු වූවත් මෙහිදී මුදලට වඩා කොළඹ වරායේ කාර්යක්ෂමතාවය පෙන්වීම වඩාත් වැදගත් වන අතර ලෝකය තුළ මේ පර්යන්ත ත්‍රිත්වය ශ්‍රී ලංකාවේ කොළඹ වරාය තුළයි කතා බහට ලක්වන්නේ ඒ අනුව සිදුකරන කාර්යනුත් කොළඹ වරාය සතු ක්‍රියාකාරකම් ලෙසයි ලෝක පිළිගැනීම. ලාභයට වඩා පහසුකම් සැපයීම මූලිකව ගෙන කටයුතු කරන්නේ ඒ අනුවයි, මුදල් සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක විය හැකි අතර එය අතුරු ආදායමක් ලෙස ගිවිසුම් ගතවීමේ අවස්ථාවකට පැමිණිය හැකිය.

එම එකඟතා ගිවිසුම සඳහා මෙහෙයුම් අධ්‍යක්ෂ ජයන්ත පෙරේරා, සී.අයි.සී.ටී.පර්යන්තයේ වාණිජ මෙහෙයුම් සාමාන්‍යාධිකාරී කැත්‍රිනා ජයසුන්දර, එස්.ඒ.ජී.ටී.මෙහෙයුම් අධ්‍යක්ෂ උපාලි ජිනදාස යන මහත්ම මහත්මීහු අත්සන් තැබූහ.

**සටහන -උපුල් ගුරුගේ**



# කොළඹ වරාය ලොව විශිෂ්ටතම සම්බන්ධිත වරායයන් අතර 13 වන ස්ථානයට

Drewry වරාය සම්බන්ධතා දර්ශකය අනුව කොළඹ වරාය ලොව විශිෂ්ටතම සම්බන්ධිත වරායන් 20 අතර 13 වැනි ස්ථානය හිමිකර ගෙන ඇත. 18 වැනි ස්ථානයේ පසුවූ කොළඹ වරාය 2017 සිව්වැනි කාර්තුවේ දී මෙලෙස වරායයන් පහක් අභිබවා මුල්පෙළට පැමිණීම සුවිශේෂිත ය. ඒ මෙම ශ්‍රේණිගත කිරීමට අලුතෙන් එකතු වූ ජෙබෙල් අලි සහ අල්ජෙසිරා වරායන් ද ඇතුළත්ව ය.

## Drewry Port connectivity Index

Global Container Port Connectivity Index, 4Q17 (Top 20 ports)

| Global ranking 4Q17 (3Q17) | Port | Region | Mainline services per week | Number of trade routes served | Connectivity index score |
|---|---|---|---|---|---|
| 1 (1) | Shanghai | Greater China | 172 | 6 | 100.0 |
| 2 (2) | Ningbo | Greater China | 163 | 6 | 94.8 |
| 3 (3) | Singapore | South East Asia | 158 | 6 | 91.9 |
| 4 (4) | Busan | North Asia | 101 | 6 | 58.7 |
| 5 (5) | Hong Kong | Greater China | 87 | 6 | 50.6 |
| 6 (6) | Yantian | Greater China | 85 | 6 | 49.4 |
| 7 (7) | Qingdao | Greater China | 72 | 6 | 41.9 |
| 8 (8) | Port Klang | South East Asia | 66 | 6 | 38.4 |
| 9 (12) | Shekou | Greater China | 66 | 6 | 38.4 |
| 10 (9) | Kaohsiung | North Asia | 64 | 6 | 37.2 |
| 11 (10) | Rotterdam | North West Europe | 62 | 6 | 36.0 |
| 12 (11) | Antwerp | North West Europe | 61 | 6 | 35.5 |
| 13 (18) | Colombo | South Asia | 59 | 5 | 28.6 |
| 14 (13) | Savannah | East coast North America | 53 | 6 | 30.8 |
| 15 (21) | Jebel Ali | Middle East | 52 | 5 | 25.2 |
| 16 (14) | Xiamen | Greater China | 52 | 6 | 30.2 |
| 17 (16) | Guangzhou (Nansha) | Greater China | 51 | 6 | 29.7 |
| 18 (25) | Algeciras | West Med | 47 | 6 | 27.3 |
| 19 (15) | Le Havre | North West Europe | 47 | 6 | 27.3 |
| 20 (17) | New York | East coast North America | 47 | 6 | 27.3 |

වරායයන් හා පර්යන්ත සම්බන්ධ තොරතුරු, ලොව බහලු මෙහෙයුම් වරායයන් හා ඒවා සම්බන්ධ කරගත හැකි ආකාරය ඉලක්ක කර ගනිමින් ප්‍රකාශයට පත් කෙරෙන Drewry වරාය සම්බන්ධතා දර්ශකය (Drewry Global Container Port Connectivity Index) ප්‍රධාන ගෝලීය කලාප 7 කට අයත් වරායයන් පිළිබඳව මිනුම් දඬු සහ නිර්දේශයන් ඉදිරිපත් කරයි. මෙහිදී එක් එක් වරායයන් කෙතරම් කලාප ගණනාවක් සමග සෘජුව සම්බන්ධ වන්නේ ද යන්නත් සතිපතා එකී වරායන් වෙත පැමිණෙන ප්‍රධාන නෞකා සංඛ්‍යාව පිළිබඳව අවධානයට ලක්කරයි.

පසුගිය දා වරාය හා නාවික අමාත්‍යාංශයේ පැවති කොළඹ වරායේ සියලු බහලු පර්යන්ත මෙහෙයුම්කරුවන් හා එම ව්‍යාපාරයට සම්බන්ධ සියලු පාර්ශවයන්ගේ හමුවේ දී අදහස් දැක්වූ වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා.

''කොළඹ වරාය බහලු මෙහෙයුම් ඉතිහාසයේ සුවිශේෂි සන්ධිස්ථානයකට එළඹෙමින් සියලු බහලු පර්යන්තයන්ගේ සුසංයෝගී දායකත්වයෙන් බහලු මෙහෙයුම් මිලියන 6.1 සීමාව ඉක්මවීමට සමත් වූ බවත්, මේ වසර අවසානයේ බහලු මෙහෙයුම් මිලියන 7 ඉක්මවීමට අපේක්ෂා කරන බවත් පැවසීය. තවද, කොළඹ වරාය ජාත්‍යන්තරයේ ඔසවා තැබීමට සුදුසු ඉදිරි පියවර නිර්මාණය කරන බවත් ඒ සඳහා කොළඹ වරාය හා සම්බන්ධ සියලු පාර්ශවයන්ගේ දායකත්වයෙන් යුතුව නව නැව් සේවා කොළඹ වරාය වෙත ආකර්ශනය කර ගැනීමට කටයුතු කරන බවත් පැවසී ය.''

ශ්‍රී ලංකා වරාය අධිකාරිය කොළඹ වරාය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් කොළඹ වරාය තුළ ක්‍රියාත්මක ප්‍රධාන පර්යන්ත ත්‍රිත්වය වන JCT, CICT යන SAGT පර්යන්ත සමග සාමූහික ගිවිසුමට අත්සන් කිරීම පසුගියදා වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණි. එහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා.

''පර්යන්ත අතර තරගකාරීත්වය තිබීම වැදගත් වන්නාසේම පර්යන්තයන් අතර සාමූහිකත්වය තිබීම ද ඉතා වැදගත් බැව් පැවසීය. තවද, ආසියාවේ සිට යුරෝපය දක්වා පැතිරි නාවික මාර්ගය තුළ මේ වන විට සම්බන්ධතා 17 ක් පවතින නමුත්, කොළඹ වරායට මේ වන විට ඉන් සම්බන්ධතා 03 ක් යටතේ බහලු නෞකා පැමිණෙන බවත්, එවැනි සම්බන්ධතා තවදුරටත් වර්ධනය කර ගැනීමේ අභියෝගයක් කොළඹ වරායට ඇති බවත්, විශේෂයෙන්ම කොළඹ වරාය රැක ගැනීම උදෙසා කොළඹ වරාය සතු බහලු පර්යන්තයන් ප්‍රවර්ධනය කළ යුතු බැව් ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා පැවසීය.''

# කොළොම් තොටින් සමු ගන්න ද හදවතින් අප ඔබ සමගයි

**පසුගිය දා වරාය අධිකාරියේ සේවයෙන් සමුගත් සේවක මහත්ම මහත්මීන්**



මැරීන් රිග්ට් අංශයේ සේවය කළ බී.පී. විමලසිරි මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ජයබහලු පර්යන්තයේ සේවය කළ ඒ.සී.කේ. කෝදාගොඩ මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



තොරතුරු පද්ධති කොට්ඨාශයේ සේවය කළ සිරිකුමාර මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ප්‍රවාහන අංශයේ සේවය කළ පරාක්‍රම මල්ලවආරච්චි මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



PVQ හි සේවය කළ ගුණපාල ගම්ලත් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



මැරීන් රිග්ට් අංශයේ සේවය කළ කේ. පියරත්න මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



වානේ සැකසුම් අංශයේ සේවය කළ කේ.ඒ. ඩෙන්සිල් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ජයබහලු පර්යන්තයේ සේවය කළ කේ.ආර්. නිමල් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ජයබහලු පර්යන්තයේ සේවය කළ එම්.එන්. කරුණාතිලක මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ඉංජිනේරු කොට්ඨාශයේ සේවය කළ එම්.කේ.එස්. චන්ද්‍රසිරි මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



සුභසාධක කොට්ඨාශයේ සේවය කළ එම්. ගුණපාල මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ජයබහලු පර්යන්තයේ සේවය කළ එම්. බුද්ධදාස මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



නීති කොට්ඨාශයේ සේවය කළ නයනා චන්ද්‍රානි මහත්මිය, වරාය සේවයෙන් සමුගත් දා...



ඉංජිනේරු කොට්ඨාශයේ සේවය කළ ආර්.පී. සෙනෙවිරත්න මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ආරක්ෂක කොට්ඨාශයේ සේවය කළ ආර්.අයි.බී. පියදාස මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ජයබහලු පර්යන්තයේ සේවය කළ සරත් රත්නසිරි මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



විදුලි අංශයේ සේවය කළ ඩබ්.එම්.ආර්. ප්‍රේමතිලක මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



සේවාසැපයුම් කොට්ඨාශයේ සේවය කළ ඩබ්.එම්. සුමතිදාස මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ආරක්ෂක කොට්ඨාශයේ සේවය කළ සෙනරත් යාපා මහත්මිය, වරාය සේවයෙන් සමුගත් දා...



මුහුදු නිර්මාණ අංශයේ සේවය කළ ඩබ්. මෛත්‍රීපාල මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



# ජය බහලු හා සමගි පර්යන්තයන්

## සිංහල දමිල අලුත් අවුරුදු සමයේ දී අඛණ්ඩව බහලු මෙහෙයුම් සිදු කරයි

ගත වූ සිංහල දමිල අලුත් අවුරුදු සමයේ දී, විශේෂයෙන් අප්‍රේල් 13, 14 දෙදින තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයබහලු පර්යන්තය හා සමගි බහලු පර්යන්තය, බහලු මෙහෙයුම් අඛණ්ඩව කාර්යක්‍ෂම ලෙස සිදුකර තිබේ.

ජයබහලු පර්යන්තයේ හා සමගි බහලු පර්යන්තයේ ග්‍රැන්ට්‍රි දොඹකර 20ක් හා 18ක ක්‍රියාකාරීත්වයෙන් යුතුව ප්‍රධාන නෞකා 05ක් හා පෝෂක නෞකා 08ක් අප්‍රේල් මස 13 හා 14 යන දෙදින තුළ මෙහෙයුම් සිදු කර මෙම සාර්ථකත්වය කරා ලඟා වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකි වී තිබේ. ඒ අනුව අප්‍රේල් මස 13වන දින ජයබහලු පර්යන්තය හා සමගි බහලු පර්යන්තය හා එක්ව අඩි 20 සමජ්කක බහලු 7459ක් හා අප්‍රේල් 14වන දින අඩි 20 සමජ්කක 6259ක බහලු මෙහෙයුම් ධාරිතාවයක් සිදු කිරීමට හැකිව ඇත.

2017 වර්ෂයේ සමස්ත කොළඹ වරායේ බහාලු මෙහෙයුම් ප්‍රමාණය වූ අඩි 20 සමජ්කක 6,209,068 ප්‍රමාණයෙන් අඩි 20 සමජ්කක 2,010,702ක් මෙහෙයවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයබහලු පර්යන්තය සමත් වූ අතර 2017 පළමු කාර්තුවට සාපේක්‍ෂව 15.3%ක වාර්තාගත වර්ධනයක් පෙන්වීමට ද හැකි විය.

Drewry වරාය සම්බන්ධතා දර්ශකය අනුව කොළඹ වරාය ලොව විශිෂ්ටතම සම්බන්ධිත වරායන් 20 අතර 13වන ස්ථානය හිමි කර ගැනීමට ද සමත් විය. 18 වන ස්ථානයේ පසු වූ කොළඹ වරාය 2017 සිව්වන කාර්තුවේ දී මෙලෙස වරායන් 05ක් අභිබවා මුල් පෙළට පැමිණීම ද සුවිශේෂිත ය. මෙම ශ්‍රේණිගත කිරීමට අනුව කොළඹ වරාය ආසියාවේ විශිෂ්ටතම සම්බන්ධිත වරායන් අතරට පැමිණ තිබේ.

කොළඹ වරායේ බහලු මෙහෙයුම් ක්‍රියාකාරීත්වය තවදුරටත් සංවර්ධනය කිරීමේ අරමුණින් කෙළෙඹ වරාය තුළ ක්‍රියාත්මක ප්‍රධාන පර්යන්ත අතර සාමුහික අවබෝධතා ගිවිසුමකට අත්සන් කිරීම ද පසුගිය දා සිදු කෙරිණි. කොළඹ වරාය බහලු මෙහෙයුම් ඉතිහාසයේ සුවිශේෂී සංධිස්ථානයකට එළඹෙමින් බහලු මෙහෙයුම් මිලියන 6.2ක සීමාව ඉක්මවීමට ද පසුගිය දෙසැම්බර් මස සමත් විය.


සටහන -උපුල් ගුරුගේ



# විධායක නිළධාරීන්ගේ සුහද හමුවේ

## නෙවැනි ඇස රැඳි රූ

# සුදී



## ඓතිහාසික නවකථාව

**හය වන දිගහැරුම...**



උඹලයි කෝමෙයි මගේ
සරීරෙට අත තියන්නේ
නාකි වුනාට මමත්
ගෑනියෙක්,
එන්න කියාපං උඹලැයි
නෑම්බියෙකුට
මාව පරිස්සා කරන්න
ඕනෑ නම්

තමුන්ගේම ලෙයින් මසින් හැදිච්ච දරුවා ගැන මහතනීගේ හිතට දනුනේ කිසිම වචනෙකට නගා ගන්න බැරි තරමේ පින් සිතුවිල්ලක් දෙයියනේ කියලා මට කිසිම බයක් හැකක් නැතිව නේත්තරා දෙක පියාගන්න පුළුවන්. මහතනී තමුන්ටම කියා ගත්තා. ඉෂ්ඨ දෙවි දේවතාවන්ට සංහිඳේ කිරි අහර පූජාවක් කරන්නත් මහතනී හිතා ගත්තා.

පිටි වෙන්න අඹරාගත්ත මැටි චූර්ණ මාළිග යෙන් ඇන්න ආපු රිදී පැසේ දමා ගත්තු මහතනී බොහෝම සැහැල්ලු සිතින් මාළිගෙ ට පිය මැන්නා.

දිය අගලට මෙපිටින් තියෙන මුර අටල්ලේ රාජකාරියේ ඉන්න ඇටිකිත්තන් හේවායෝ ටික මහතනීගේ ඉහ ඉඟ අතගාලා පරිස්සා කරන්න සූදානම් වුණා.

හ් නේ... උඹලයි කෝමෙයි මගේ සරීරෙට

අත තියන්නේ නාකි වුනාට මමත් ගෑනියෙක්

එන්න කියාපං උඹලැයි නෑම්බියෙකුට

මාව පරිස්සා කරන්න ඕනෑ නම්,......

යකෝ මේකිගේ රාජ උස්නේ බලාපල්ලකෝ. බිසොවුන් වහන්සේ කෙනෙක් කියා හිතාන ඇති''

''උඹලට ඒවායින් කාරි නෑ. මාව පරිස්සා කරන්න ඕනෑ නම් සුනංගු නැතුව එන්න කියාපන් බවලතෙකුට''

''සොබනි ඇත්තියේ මෙහෙ වරෙන් ඇබින්දකට ''

'මොකෝ බොලා කෑමොර දෙන්නේ ඩිංගිත්තක්වත් විවේක ගන්න දෙන්නැතිවා... අපොයි දෙවියනේ මේ සුදී ඇත්තගේ මැණියන් දෑ නොවැ. කොල්ලනේ තොපිට අමු කැවිලැයි සුදී ඇත්තිගේ මැණියන්දෑව බොලා අඳුන්නේ නැතිවා බොහෝ ම අපූරුයි. බොහෝ ම අපූරුයි....

සොබනි ඇත්තිගේ වචනවල තිබ්ච්ච ගොරෝසුකමට මුර අටල්ලට අළුතෙන් බඳවාගත්තු මුර පන්නේ කොලු නඩේම තක්කු මුක්කු වෙලා බලාන හිටියා.

''අපේ රජ්ජුරුවන් වහන්සේගේ නායක සෙනෙවි සුධීර උත්තමයා අතගන්න ඉන්නේ මෙතුමියගේ දෝණියන්දෑ බව හැබෑවටම උබලා දන්නෙ නැතෙයි.

සොබනි ඇත්ති මේ තරම් තමාට ඇඟෑලුම්කම් පාන කාරණාව මහතනීට තේරුණේ එතකොටයි. දෝණියන්දෑ ගැන හිතේ තිබ්ච්ච ආදරේ ගව්රවේකට පෙරලිලා හිත ඇතුළේ අමුතුම විපරියාසයක් කරනවා මහතනීට දැණුනා. රජ ගෙදර අන්තඃපුරේ ඇත්තියන්ව මැටි චූර්ණ තනන තමුන්නේ දෝණියන්දෑ රාජ මහේෂිකාවක් තරමටම විසේස වේගෙන එන හැටි ගෝතපබ්බත විහාරේ එළිවැටක් තරමට හිත පිරෙව්වා.

සුදී උන්ගේ අතීරණේක. තමුන්ගෙයි සුධිර ඇත්තන්ගෙයි පලහිලව්ව ගැන මාළිගාවේ හුඟ දෙනෙක් දනන් හිටිය බව මේතාක් දුරකට සුදිගේ හිතට ගෙනාවේ ආරස්සාකාරි හිතුවිල්ලක්. ඒත් ඒ කාරණාව තවදුරටත් වලංගු නැති බව සුදීගේ නේත්තරා ඉදිරියේම පේන්න පටන් ගත්තා. පසුගිය දොහොක මැණියන් කැටිව එන්නට අන්තඃපුර මාළිගා ඉසව්වට ගියපු දොහේ නාකි පෙරෙවි බමුණෙකුගේ කතාවට සුදීගේ පංචස්කන්දේ ආයෙමත්

'' ආ ...සුදී කෙල්ලේ... උඹ රාජ කුමාරිකාවකටත් වඩා හැඩයි නොවැ... හැබෑව හැබෑව නැත්නං කොහොමයි අර තරම් උදාර සෙනෙවි කෙනෙක් දපනේ දාගන්නේ.... ඒත් කෙල්ලේ දන්නම් ඒවා ඉෂ්ට වෙන්නේ නැතිවා .... උඹේ පියයි සුධීර ඇත්තොයි ආයේ එනවානම් ඉතින් මේ සම්මජ්ජාතියේ දී බොරු උන්දල නෞකාවට ගොඩවුණොත් මාරයාගේ අසුභ හෝරාවේදීමයි. මේ මමමයි ඒ නැකත තනා දුන්නෙත්...

බවලතෙක් වගේ කෙකර ගාමින් හිනාවෙන, තමුන්ව ගිලින්න වගේ බලා ඉන්න වයසක පෙරෙවි බමුණගේ මූණටම කෙළ පිඩක් ගැසීමේ සිතවිල්ල ආයාසයෙන් මැඩගත්ත සුදි වදන් කිහිපයක් අමාරුවෙන් ගැට ගහ ගත්තා.

''ඔබතුමා ඒ වගේ නොහොබිනා දෙයක් කලේ ඇයි බමුණුතුමනි.

උබ .. උබ...උබ..

උබ තමයි බොල මේ හැමදේටම මුල....

බලාපන් කිලෝගානක් බර රන් රිදී මුතු මැණික් පෙරවාගෙන ඉන්න දුටුව මතින් හිස රැජා හැදෙන කොණ්ඩා සැරසිලි කොරාන ඉන්න රන් දෝළියකටත් වඩා උඹ කොයිතරම් හැඩකාර ද කියා, එහෙව් එකේ මගේ දුක් ගන්නා ඇත්ති වෙන්න උබට බැරාවා... උබට රන්දෝලියකටත් වඩා සැප සලසන්න මට හැකි බව උඹ දන්නවා...

සුදීගේ හිතේ අරක්ගත්ත දේවතාව සුදීට උපදෙස් දෙන්න පටන් ගත්තා.

'සුදියේ හිත පාලනය කරගන්, ගිනි පිටවෙන කේන්තිය මේ අපූරු බමුණාට පෙන්නන්නැතිව ඉන්න තාක් දිනුම තමුන් ලඟ තියෙන බව සුදී අමතක කරන්න එපා. වාග් ප්‍රහාරයෙන් තී මේ අජූත බමුණාව පරාද කල යුතුයි''

හිතේ ඇතුළතින් ඇසුණු මේ හඬත් එක්කම සුදීගේ හිතට අමුතුම පණක් ආවා.

''අනේ අපගේ පූජණීය බ්‍රාහ්මන තුමා කොයිතරම් උදාරයි ද. මගේම පියාගේ වයසට වඩා වැඩි වයසේ පසුවන ඔබතුමා භද්‍ර යෞවනයේ සිටින මා දරුකමට හදා ගැනීමට සිතීම පවා මට සිහිලත් බමුණුතුමා. ඒත් මෙතුවක්කල් දරුඵල නැතිව ඉන්න ඔබ දෙපල මව පියා නොමැති අනාත දරුවෙකු පැටිවියේදීම ඇතිදැඩි කළා නම් තමා සුභඵල දායක වන්නේ.

සුදීගේ වචන බොහෝම පැහැදිලියට කරුණාවන්තව ගලා ගියත් නුවරක් දමා අළු කරවන තරමේ දෑස්වලින් කියාපාන කේන්තිය හමුවේ එය නොදක ඉන්නට මහළු බමුණා අසාර්ථක උත්සාහයක යෙදුණා.

''කෙරාටික වෛශ්නාවී... මම උඹට මගේ තරම පෙන්වන්නම්... හිතින් තමාටම සපථ කරගත් පෙරෙවි බමුණා වේගයෙන් සුදි පසුකරගෙන ගියා.

උපුල් ගුරුගේ

# කාව්‍යාංජලිය
තොටුපලේ කවිතොට

තුඩග උණුසුම්
අංගුලක වැද
කම්පිතව හද වෙණ තතක්
සුසර සරයෙන් නැගුණු වෙණ නද
පණ පොවයි වල් වැදුණු
බාඳුරා යායම
අතීරණ සජනයක පැටලී
වන්දනාවක ගිය හිත අරන්
බැස ගියා ඈ
කිසිත් නොදැනම
මල් හිනා මට ඉහිරමින්...

- ශශංගීලා

## තනිවුණු සඳ

ඉර නොඑන හවසට
අහස තරු කැට
හෙමින් ඇහිඳින
ඒ තරු වල පිපුණු
කඳුළු මල් වල
සුවඳ විඳිමින
දුකට දුක් ගී
කිසිත් නොකියන
සඳත් අඳුරෙම
හෙමින් ඇවිදින

- දිමුතු

## ජයබහලුව

පෙරදිග ලෝකයේ
දිදුල මුතු ගෙන
ඇමුණු මාලේ
මැද දිලෙන
පදක්කම

අමිල - ජයබහලු

සුදු අරලියා පෙති
පිපි මල් පොහොට්ටුවේ
ඔය නෙත් ගැටී මගේ සියොලඟ
ගිනි ගනිමින් දැවේ
ඔබ පෙළයි මා දෙනෙත්
මේ මහලු මගෙන්
උදුරනවාද වහලු හැඟුම්

බලා ඉම් රැයේ
සීතල මුවාකර ඔබෙන්
ඔය මීවිතෙන් මගේ දෙතොලග
තෙමනවද ඉතින්

තුන් ලෝකයට හොරෙන් ඔය මුව
සිප ගනිම් සැනින්
හෙට අරුණැල්ල වැටී ඔය වත
දිලෙනවිට රුවින් හැඩකාර
තරුණ බඹරුන් අතපතා ඒවි
ඔබෙන්
උන් කෙලෙස දැන ගම්ද
කලුවර වසාලු හැඟුම්

- රොෂාන් විජේසිංහ

## තුටින් නිදියන්

මගේ අකුරින් දවස ගානෙම
ඔය කියනා නිසා රස කවි
ලියා තැබුවා අහසෙ අයිනක
නුඹට තරුවක දෙකක දුර ඇත...

රැයේ මැදියම පවා අමතා
හාදු ඉල්ලන නිසා ඔය හැටි
සුළඟ නවතා පාර කියුවා
ඔන්න එයි සිප ගන්න මගේ මුව

ඔබ කැමති මුදු ගීත තවමත්
ගයන්නට බැරි නිසා හරිහැටි
රැහැයි මුවකට හලෙම් මීවිත
තුටින් නිදියන් ඇසෙයි කවිපැදි

සේපාලිකා ලියනගමගේ
ඉංජිනේරු කොට්ඨාශය

## සංසාරණය

අතීතය දකින්නෙමි
මතකයන් ඉපදෙනා
නිහඬ තොටුපොළක සිට
නිසල වැව් දිය මතින්...

අනන්තය සොයන්නෙමි
පුරුදු ලෙස ඇවිද යන
කිසිදාක හමු නොවන
නිසල වැව් දිය මතින්

රෑ රටා විඳින්නෙමි....
අඳුරු වියනින් මිදුණු
සිහින් හිරු රැස් කිරණ
නිසල වැව් දිය මතින්....

- ඉන්දික
තොරතුරු පද්ධති කොට්ඨාශය

## තනතුර

"කියමු බලන්නට දුවේ
පියාගේ රැකියාව කුමක්ද ?
මොකද ළමයෝ
කටේ පිට්ටුද?
මුණිවතට තිත තබා
දුන්නා ය පිළිවදන් මෙලෙස
කොක්සන් ය මගේ පියා
විපිලිසර ගුරුතුමිය
මුණුමුණුම මිතුරු කැල
පාඩමක් අතරමග
කෙනෙකුගේ දියණියක්
යකෝ මේ පංතියේ
කට කැඩුණු කතා
කියන
ඉන්දික කියපු කතාවට
රිදුම් දුනි හදවත
හොඳටෝම
කිසිම හොර බොරු නැතිව
කෙලින් කරගෙන කොන්ද
සරිකරන්නට ඇහැකි නම්
ගොඩගන්න අපේ ජීවිත
අහවල් එකට හොයනු ද
තනතුර"

නිම්නාද මුතුකුඩආරච්චි
පුහුණු අභ්‍යාසලාභී

## මලවුන්ගේ වැස්ස

හෙටින් උදාවන අපේ නැවුම් ලොව
දැහැමි මගක් වෙත යොමු කරන්නට
කැති පොලු අවි නොව
ප්‍රේමයේ අසිපත
අරගෙන එනු මැන සුහිත් මිතුරේ

ජාතිය ආගම පරයා එසවෙන
මිනිසත්කම අපි තුරුළට ගනු මැන
මමත්වයේ මඩ වගුරෙන් ගොඩවිත්
පරහිතකාමීව නැගී සිටිනු මැන

ඔබත් මමත් ඉපිද මියන මේ
ඇටකටු ගඩොලින් නිමවුනු ලෝකය
පැලුණු දෙතොල් එතරට දික් කර ගෙන
සුබ විහරන මැද ඉන්නට හැකිවේ

සිතව් මිතුරේ නැගෙව් මිතුරනේ
මිනිසුන් වෙසෙනා එලොව කනත්තට

- ප්‍රියන්ජිත් බණ්ඩාර

## අතීතය

අඟුරු මඩුව ළඟ - ලුණු අහුලන්නට
ආත්තම්මත් ආවලු ඒ කාලේ
බත්තලේ වැඩකළ සියාතාත්තාට
ආත්තම්මා හදි ගැහි කෝලිත්තං වුණාලු...
කොලුකමට සීයාතාත්තා එක්ක
බතත්ලට ආව ගිය
අපේ තාත්තත්

බත්තලට ම හරි ගියාලු...
සැසඳුමේ බිල් ලියපු උපසේන මහත්තයා
දෝණියන්දට හොයපු මනමාලයා වුණෙත්
අපේ තාත්තලු...
අඟුරු මඩුවේ කතා අහගෙන
හාබර් බතේ ලුණු ඇඹුලින්ම
උස්මහත් වෙච්ච කරදඬු
කෝටියක් සිහිනවැල්
අපේ ජීවිත හැඩකළා
වැඩකරන කළ බහලුවේ ජය
මතක බණවර දෙයි රිදුම්
සීයාතාත්තගේ අපේ තාත්තගේ
අඟුරු මඩුවේ මතක රොන්සුණු

ලලිත් සේනානායක - ක්‍රියාකරවන

**ක**වියක විශේෂත්වය විය යුත්තේ එහි අන්දැකීම් අපූර්වත්වයයි. අතීතය නම් මේ පද්‍ය රචනය අපූර්ව අත්දැකීමකින් නිර්මාණය කර තිබේ. අතීතයේ මුත්තනුවන්ගේ, සිය පියාගේත්, මවගේත් මතකයන් මේ නිර්මාණය තුළ ගැබ්වී ඇත්තේ බෙහෙවින් කාව්‍යාත්මක ලෙසය. ඒ සඳහා ඔහු උපයෝගි කර ගන්නා භාෂාව ද අපූර්වත්වයෙන් යුතුය. එමෙන්ම සුපුරුදු ආකෘති විලාසයකින් තොරව වෙනස් ආකෘතියක් භාවිත කරමින් එම අත්දැකීම ඉදිරිපත් කර තිබේ. මෙහි අන්තර්ගත අඟුරු මඩුව, බත්තල, හාබර් බත, වැනි යෙදුම් අත්දැකීම් මට අදාල භාෂාත්මක උපක්‍රම ලෙද භාවිත කර තිබේ. දීර්ඝ අතීතයක විස්තර කෙටි වදන් වැල් සමූහයකින් කියා පෑමට කවියා සතු ශක්තිය අගය කළ යුතුය. කාව්‍යකරණයෙහිලා කිසියම් ප්‍රවීනත්වයක් ඇති රචකයකු බව පැහැදිලි වේ.

**සමුද්‍ර වෙත්තසිංහ -කිච්චර ගීත රචක සාහිත්‍යවේදී**

**හොඳම කාව්‍ය නිර්මාණයට**
**සමුද්‍ර වෙත්තසිංහ ප්‍රකාශන ආයතනයෙන්**
**විශේෂ තිළිණයක් සහ කාව්‍ය ඇගයුමක්**

රඟ මඬල

# ගොඩගේ අත්පිටපත් තරගයේ ජයග්‍රාහකයා වීම මගේ මහන්සියට ලැබුණු ත්‍යාගයක්

## රොෂාන් විජේසිංහ



**ඔබ ගැන කිව්වොත්...**
මම මුදල් කොට්ඨාශයට අනුයුක්තව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වසර 27 ක් තිස්සේ සේවය කරනවා.

**මොකක් ද ලඟදි සිද්දවෙනවා කියන්නෙ ?**
ආ.... ඒක කාලයක් තිස්සෙ බලාපොරොත්තු වුන දෙයක්. මගේ පොත් කිහිපයක් එළි දැක්වීම සිද්ධවෙනවා. මගේ ආයතනයේදීම ඒක සිදුවීම තමයි විශේෂත්වය. 2018 අප්‍රේල් 25 වෙනිදා මහපොල ශ්‍රවණාගාරයේ දී.

**මොනවද මේ පොත් ?**
"හිම කන්දේ සුරතලිය" කියලා පරිවර්තනයක්. "මැටි පිඩක් මම..." කියලා කවි පොතක්. "කෙළෙස්බර" කියලා නවකතාවක්. ඔය අතරින් කෙළෙස්බර නවකතාව තමයි 2018 ගොඩගේ අත්පිටපත් තරඟයේදී හොඳම නවකතාව විදියට තේරුණේ.

**මට පේන්නේ ඔබගෙ නිර්මාණ අංශ ගණනාවක් ඔස්සේ යනවා..?**
සත්තකින්ම. ඒත් මං එහෙම හිතන්නේ නෑ. මේ සියල්ලම එකම දෙයක්. මහ වෙනසක් නැහැ. අපි නිර්මාණකරනයට සැබෑවට යොමු වුනාම ඒකෙ සීමාවක් නැහැ. ඔබත් ඒකට උදාහරණයක්.

**ඔබ වඩාත් කැමති මොන අංශයට ද..?**
ඒක ස්ථිර දෙයක් නෙවෙයි. වෙනස් වෙනවා. අපේ ජීවිත වගේමයි. අනිත්‍යයි. මට වැඩියෙන්ම සම්මාන සහතික ලැබිලා තියෙන්නෙ කෙටිකතාවලට. මමත් වඩාත් කැමති කෙටිකතා ලියන්න.

**ඒත් ඔබ කෙටිකතා පොතක් තවම එළි දක්වලා නෑ...?**
සත්තකින්ම. මට මගේ හොඳම කෙටිකතා ටික තෝරගන්න බැරි කමක් තියෙනවා. මම ඒකට බයයි කිව්වොත් තමයි හරි.

**වැඩියෙන්ම කැමති දේට බයයි කියන්නෙ විහිලුවක් නේද ?**
එහෙමද? වෙන්නත් ඇති. ඒකත් අමරදේවගේ සිංදු වගේ තමයි. වැඩියෙන්ම ආසයි තමයි. ඒත් කියන්න බයයි.

**ලෝක කෙටිකතාව බොහෝ ඉදිරියට යනවා. අපේ කෙටිකතා ගැන මොකද හිතන්නෙ ?**
හොඳ කෙටිකතා ලියන අලුත් පරපුරක් ඉන්නවනේ. දවසක චෙකොෆ් කෙනෙකුත් අපෙන් බිහිවෙයි.

**ඔබගෙ පරමාදර්ශය ඇන්ටන් චෙකොප්ද? ඊටත් බොහෝ ඈතකදී බිහිවුන හිමකබාය වගේ**

**කතාවකට ඔබ දෙන තැන මොකක්ද?**
බොහොම ඉහළ තැනක. මම වැඩිම වාර ගණනක් කියවපු කෙටිකතාවත් ඒකමයි. මම හිතන්නෙ ඔබත් එහෙමයි. රුසියානු සාහිත්‍යය තමයි අපි කාටත් ආලෝකයක් දුන්නෙ. ඉස්කෝලෙ පුස්තකාලෙන් අපි ගත්තෙත් "යුද්ධය හා සාමය" වගේ පොත්.

**ඔබගෙ නිර්මාණකරනයට ආයතනයෙන් ලැබෙන සහයෝගය මොකක්ද ?**
අම්මෝ හොඳ සහයෝගයක් මට ලැබෙනවා. ඒත් ඔබ ඇහුවොත් මොන වගේ දෙයක්ද කියලා මට කියන්න බෑ. ඒක මානසික සහනයක්. මේ රැකියාව නොතිබුනානම් මට මුහුන දෙන්න සිද්ධවෙන ආර්ථික ගැටලුත් එක්ක නිර්මාණ කරන්න තියා හිතන්නවත් බැරි වේවි. ඒකම මට ලොකු සහනයක්. අනෙක් කාරණය තමයි මම මේ ආයතනයෙන් පිටවෙන්නෙ බොහොම සැහැල්ලුවෙන්. ඒ වෙලාවට රැකියාව ගැන හිතට බරක් නැතිව නිර්මාණයක් කරන්න පුලුවන්.

**කවුද ඔබට අතහිත දෙන්නෙ ?**
මේ ඔබ කරන්නෙත් ඒක තමයි. මම හිතන්නෙ වැඩිම සහයෝගය ලැබෙන්නෙ පවුලෙන්. ඊලඟට මගේ යාලුවො. කෙනෙකුට ලැබිය හැකි හොඳම යහලුවො ගොන්නක් මට ඉන්නවා. අවුරුදු 27 ක් තුළ මා උපයාගත්ත වටිනාම සම්පත තමයි ඒ. මගේ හැම කටයුත්තකදිම මේ යාලුවො මගේ ලඟ ඉන්නවා.

**අනාගත බලාපොරොත්තු....?**
ලොකු දේවල් නෑ. ඒ ඒ වෙලාවට හිතෙන දේ කරනවා. එච්චරයි.

ගුරු



# කේන්ද්‍රීය වරායක

## හෙට දවස

ටොලමිගේ ලොව ඉපැරණිතම ලෝක සිතියමෙහි ශ්‍රී ලංකාව, ඉන්දියාවටත් වඩා විශාල රාජ්‍යයක් ලෙස නිරූපිතය. දේශාන්තරණයෙහි නිමග්න වූ පුරාතන නාවිකයන්ගේ දැනුම් පද්ධතියන්ගෙන් නිර්මාණය වූ මෙම සිතියමෙහි ශ්‍රී ලංකාව කෙරෙහි එවන් සුවිශේෂි වැදගත්කමක් ලබා දීමට පදනම වන්නේ අන් රාජ්‍යන්ට සාපේක්ෂව භූගෝලීයව වශයෙන් අප රට කේන්ද්‍රීය ස්ථානයක පිහිටා තිබීම යි.

ශ්‍රී ලංකාවේ පිහිටීමට භූගෝලීය වශයෙන් සමකළ හැකි වෙනත් රාජ්‍යයක් ලොව නොමැත. අධ්‍යයතන ගෝලීයකරණය (Globalization) මගින් සිදුවූ ආර්ථික රටාවේ ගතිකත්වයත් සමග මෙහි වානිජ වටිනාකම දිනෙන් දින ඉහළ යයි. ලෝකයේ සියලු රාජ්‍යයන් යා කරන ප්‍රධාන නාවුක ගමන් මග ශ්‍රී ලංකාව ආසන්නයෙන් වැටී තිබීම ලෝකයා අභිමුඛයෙහි අප රටෙහි පවත්නා කේන්ද්‍රීයභාවය තව තවත් තීවූ කරයි.

2025 වන විට ලොව ප්‍රබල බලවත්ම ආර්ථිකය හොබවන බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය හා දකුණු අප්‍රිකාව (BRICS Nations) යන රාජ්‍යයන් සම්බන්ධ වන ප්‍රධාන නාවුක ගමන් මග ද ශ්‍රී ලංකාව ආසන්නයෙන් වැටී තිබේ. ලෝක ජනගහනයෙන් හරි අඩකටත් වඩා, එනම් බිලියන 3.6 ක ජනතාවක් මෙම රාජ්‍යයන් ආශ්‍රිතව ජීවත් වේ. තවද, වර්තමානයේ ගෝලීය ආර්ථිකයේ ප්‍රබලතම මෙහෙයුම්කරුවා වන්නේ ආසියාවයි. ඉන්දියන් සාගරය ලොව වැදගත්ම සාගරය බවට පත්ව තිබේ. එමෙන්ම, ඉන්දුනීසියාව හා ඉරාකය අතර කලාපය ලොව ගුවන් හා නාවුක ගමන් වැඩිම කලාපය බවට පත්ව තිබේ. එබැවින් අනාගත ගෝලීය ආර්ථික ක්‍රියාවලිය තුළ භාණ්ඩ සංරක්ෂණයේ කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත්වනු නොඅනුමානය.

එවන් වපසරියක් තුළ සේද මාවතේ සමුද්‍රීය සේවා සැපයුම් විශිෂ්ඨතමයා බවට පත්වීමේ ශක්‍යතාවය අප සතු වන්නේ සියලු පහසුකම්වලින් යුතු කේන්ද්‍රීය වරායන් (Hub Port) අප සතුවීමත් මත ලෝක බැංකු වාර්තාවන්ට අනුගතව කේන්ද්‍රීය වරායක පහත ලක්ෂණ අන්තර්ගත විය යුතුය.

- නාවික ගමන් මාර්ගයන්ට හා පෝෂණ වරායන්ට සමීපව පිහිටා තිබීම.
- මහා පරිමාණ නැව් හැසිරවීමේ හා ඒවාට පහසුකම් සැපයීමේ ශක්‍යතාවය.
- කාර්යක්ෂමතාවයකින් බහලු මෙහෙයුම් සිදුකිරීමේ ශක්‍යතාවය.
- භූගෝලීය සිමාවන් තුළ පෝෂණ සේවා සැපයීමේ ශක්‍යතාවය.
- විකල්ප මෙහෙයුම් ගාස්තු.
- ගුවන් හා අභ්‍යන්තර ප්‍රවාහනය කිරීමේ ශක්‍යතාවය.

උක්ත ලක්ෂණ පිළිබඳව විශ්ලේෂණය කිරීමේ දී ගම්‍ය වන්නේ කේන්ද්‍රීය වරායක් ලෙස අප වරායේ පරිසාධික මට්ටම සාධනීය වන බවයි. මේ වන විටත් ලෝක වරාය ශ්‍රේණිගත කිරීමේ තුළ 23 වන ස්ථානය දිනා ගැනීමට හැකියාව ලැබී ඇත්තේ වරායක් ලෙස JCT (Jaya Container Terminal), UCT (Unity Container Terminal), SAGT (South Asia Gateway Terminal) හා CICT (Colombo International Container Terminal) යන සියලු පර්යන්තයන්ගේ (Terminal) සහයෝගීතාවය, කාර්යක්ෂමතාවය හා මානව සම්පත්හි ඵලදායිතාවයත් තාක්ෂණික භාවිතයත් තුළිනි. තවමත් සංවර්ධිත මට්ටමෙහි පවතින ECT පර්යන්තය (East Container Terminal) බහලු මෙහෙයුම් හැසිරවීම සඳහා එක් කිරීම ගෝලීය තරගකාරිත්වය හමුවේ අත්‍යාවශ්‍ය කරුණකි. වරායක් ලෙස කොළඹ වරාය ජාත්‍යන්තර ය හමුවේ ඔසවා තැබිය හැකිවන්නේ එවිටය.

**සටහන**
**චතුෂ්කා ජීවන්ති**

# குளோபல் போர்ட் போரம் 2018ஆம் ஆண்டிற்கான துறைமுக அதிகாரசபை விருது - இலங்கை துறைமுக அதிகாரசபைக்கு




குளோபல் போர்ட் போரத்தினால் நான்காவது தடவையும் நடாத்தப்பட்ட விருது வழங்கும் நிகழ்வில் “2018ஆம் ஆண்டின் துறைமுக அதிகாரசபை” விருதினை இலங்கை துறைமுக அதிகாரசபை ஈட்டிக்கொண்டமை குறிப்பிடத்தக்கது. டுபாய் கிராண்ட் ஹயாட் ஹோட்டல் வளாகத்தில் நடைபெற்ற இவ்விருது வழங்கும் நிகழ்வில் இலங்கை துறைமுக அதிகார சபையினை பிரதிநிதித்துவப்படுத்தி பிரதான முகாமையாளர் (சந்தைப்படுத்தல் மற்றும் வணிக முன்னேற்றம்) உபுல் ஜயதிஸ்ஸ மற்றும் பிரதான முகாமையாளர் (தொடர்பாடல் மற்றும் மக்கள் தொடர்பு) நளின் அபொன்சு ஆகியோர்களுக்கு ஐக்கிய அரபு எமிரேட்ஸ் இராச்சியத்தின் வெளிநாட்டு தொடர்பு மற்றும் சர்வதேச ஒருமைப்பாட்டு அமைச்சின் பொருளாதாரம் மற்றும் வணிக தொடர்பு திணைக்களத்தின் பிரதி பணிப்பாளர் மூனா அல்மைன் அவர்களின் கரங்களினால் இந்த விருது வழங்கப்பட்டது.

துறைமுக மூலோபாய திட்டங்கள் மற்றும் துறைமுக அபிவிருத்தி, துறைமுக தன்னியக்கமாக்கல், துறைமுக நிதிசார் மற்றும் இயக்க செயலாற்றுகை பற்றிய கலந்துரையாடலுடனான இருநாள் விசேட கருத்தரங்கும் இந்த விருது வழங்கும் நிகழ்விற்கு இணையாக நடாத்தப்பட்டது.

2008ஆம் ஆண்டில் சிங்கப்பூர் கொஸ்மொபொலிடன் குளோபல் போட்டில் வணிக நோக்கினை முதன்மையாகக் கொண்டு ஆரம்பிக்கப்பட்ட உலக துறைமுக அமர்வு (Global Ports Forum-GPF) இனால் வருடாந்தம் இந்த விருது வழங்கும் நிகழ்வு ஏற்பாடு செய்யப்படுகின்றது. அங்கு உறுப்பின துறைமுகங்களின் செயற்பாடு மற்றும் அதன் எதிர்கால அபிவிருத்திப் பங்களிப்பு பற்றி நிதமும் கருத்திற் கொள்ளப்படும்.

உச்ச பங்களிப்பு மற்றும் தொழில்துறை தன்மையுடன் செயலாற்றுகின்ற குறிப்பிடத்தகு பிரதேசங்களிலுள்ள துறைமுகம் மற்றும் முனையம் பற்றியும் அவற்றின் சிறப்பினை அடைய கையாண்ட வழிமுறைகளை கவனத்திற்கொண்டு மதிப்பீட்டுக்குட்படுத்தி பல்வேறு துறைகளின் கீழ் இம்முறை இந்த விருது வழங்கும் நிகழ்வு நடாத்தப்பட்டமை குறிப்பிடத்தக்கது. கொழும்பு துறைமுகத்தின் SAGT முனையம் தெற்காசியாவின் சிறப்புமிகு முனையமாக கடந்த ஆண்டில் விருதுக்கு உள்ளாக்கப்பட்டதுடன் தொடர்ச்சியாக இந்த முறையும் இந்த விருதினை தம் வசம் உரித்தாக்கிக் கொண்டது.

இலங்கை துறைமுக அதிகார சபையின் மற்றும் கொழும்பு துறைமுகத்தின் அதிகுறிப்பிடத்தகு வெற்றிக்கு தற்போதைய அரசின் துறைமுக மற்றும் கப்பல்துறை அமைச்சர் கௌரவ மஹிந்த சமரசிங்ஹ அவர்களின் சிறப்புமிகு தலைமைத்துவமும் இலங்கை துறைமுக அதிகார சபையின் தலைவர் கலாநிதி பராக்கிரம திஸாநாயக்க அவர்களின் வழிகாட்டலும் முகாமைத்துவமும் துறைமுக கையாளல் செயற்பாடு தொடர்பாக சகல தரப்பினரும் நல்கிய பங்களிப்பு மற்றும் தொழிற்சங்கங்கள் போன்றே சகல துறைமுக ஊழியர்களுக்கிடையிலான உறவு உச்ச அளவில் முன்னேற்றமடைந்துள்ளமை போன்ற காரணிகளால் இவ்வெற்றியை அடைந்து கொள்ள முடிந்தமை குறிப்பிடத்தகு விடயமாகும்.

தற்போது இலங்கை துறைமுக அதிகார சபை மூன்றாண்டு அபிவிருத்தி திட்டத்தினை தயாரித்துள்ளதுடன், அதனூடாக எதிர்காலத்தில் அபிவிருத்தி நடவடிக்கைகள் துரித கெதியில் முன்நோக்கி கொண்டு செல்வதற்கும் அதனூடாக கொள்கலன் கையாளல் மேலும் உயர்வடையச் செய்து கொழும்புத் துறைமுகம் ஆசியாவின் கேந்திர முக்கியத்துவமிகு துறைமுகமாக மாற்றுவது எதிர்பார்ப்பாகும்.

## துறைமுகத்தின் நாளைய தினத்தினை கட்டியெழுப்பும் புது மனித வளத்திட்டம்

இலங்கையை கடல்சார் வலயத்தின் கேந்திரத்தளமாக மாற்றுவதற்கு அரசு கொண்டு செல்லும் வேலைத்திட்டத்தினை செயற்பாட்டு மிக்கதாக மாற்றும் பொருட்டு இலங்கை துறைமுக அதிகாரசபைக்கு புது மனிதவளக் கொள்கையொன்றினை அறிமுகப்படுத்துவதற்கு துறைமுக முகாமைத்துவம் நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றது. சர்வதேசத்துடன் ஒன்றிணைந்த சிறப்புமிகு சேவை வழங்கும் நிறுவனமொன்றின் ஊழியர்கள் அறிவு ஆக்கத்திறன் மற்றும் எண்ணக்கருக்களை முன்னேற்றிக்கொண்டு புது மனிதவள கொள்கையொன்றின்கீழ் இலங்கை துறைமுக அதிகாரசபையானது மனிதவள முறைகேடுகள் மற்றும் சம்பள முரண்பாடுகளை முற்றாக நீக்கி வெளிப்படைத்தன்மையுடன் நடவடிக்கைகளை மேற்கொண்டு ஆட்சேர்ப்பு நடைமுறையிலிருந்து ஓய்வுபெறும்வரை மனிதவளத்துடன் ஒன்றிணைந்த செயற்பாடுகளை திடமான அடிப்படையில் கொண்டு செல்வது இதன் முக்கிய நோக்கமாகும். அதற்கமைய துறைமுக அதிகார சபையின் மனித வளமாக சகல ஊழியர்களையும் சமமான விதத்தில் மதிக்கும் கொள்கையின் அடிப்படையில் மனித வளத்தினை இதனூடாக முன்னேற்றுவதற்கு எதிர்பார்க்கப்படுகின்றது. இதற்காக சகல ஊழியர்களினதும் தொழிற்சங்க பிரதிநிதிகளினதும் உரிய பங்களிப்பினை பெற்றுக் கொள்ளவும் திட்டமிட்டுள்ளோம்.

பல ஆண்டு காலங்களாக சம்பள முரண்பாடு மற்றும் பதவியுயர்வு கிடைக்கப் பெறாமல் எந்த வித மாற்றமும் இன்றி கடமைக் காலத்தினை கழித்து அநீதிக்கு உள்ளாக்கப்பட்ட வெவ்வேறு தொழில் தரங்களை அறிந்து கொண்டு புதிய முறைமையினூடாக மஹபொல கடலக கல்விக் கலாசாலையுடன் தொடர்புபட்ட உயர்நிலை பயிற்சிப் பாடநெறி மற்றும் பரீட்சை முறையினூடாக பதவியுயர்வு உட்பட சகல வரப்பிரசாதங்களையும் ஊழியர்களுக்கு பெற்றுக் கொடுப்பதற்கு உத்தேசிக்கப்பட்டுள்ளன.

தற்போதைய அரசின் துறைமுகம் மற்றும் கப்பற்றுறை அமைச்சர் கௌரவ மஹிந்த சமரசிங்ஹ அவர்களின் சிறப்பான தலைமைத்துவத்தின் கீழ் இலங்கை துறைமுக அதிகாரசபையின் தலைவர் கலாநிதி பராக்கிரம திஸாநாயக்க அவர்களின் முகாமைத்துவமும் துறைமுக இயக்கச் செயற்பாட்டிற்கு தொடர்புடைய சகல தரப்பினரதும் சிறந்த பங்களிப்பினூடாக பணிப்பாளர் (மனிதவளம்) பீ.ரணதுங்க அவர்கள் உட்பட மனிதவளப் பகுதியின் பங்களிப்பும் துறைமுகத்தின் நாளைய நாள் கட்டியெழுப்பப்படும், புதிய மனிதவள கொள்கையினைத் தயாரிக்கும். இது தொடர்பாக இலங்கை துறைமுக அதிகார சபையின் பகுதித் தலைவர்கள், உயர் அதிகாரிகள், தொழிற்சங்க பிரதிநிதிகள் போன்றோரின் கருத்து மற்றும் ஆலோசனை பற்றிய விசேட கலந்துரையாடலுடனான சந்திப்பு மஹபொல துறைமுக கடலக கல்விசார் கலாசாலை கேட்போர் கூடத்தில் அண்மையில் நடைபெற்றமை குறிப்பிடத்தக்க விடயமாகும்.

## உற்ற நண்பன் !

யான் அவனை நோக்கிட்ட பொழுதினில்
அவனது விழிகளில் கண்ணீர் முட்டியது
நான் பார்த்த அவன் ஆனவன் எனது பள்ளித் தோழன்!

நான் பார்த்ததைவிட நான் பார்க்கையில்
அவனிருந்த கோலம் தான் அவனுக்குள் அழுகையை
வரவழைத்தது
வெகு நாட்களுக்கு பிறகு அவனை நான்
அப்படிப் பார்த்திருக்கக் கூடாது!

சடுதியான நிமிடங்களில் அந்த சந்திப்பு
அவனுக்குள்ளும் எனக்குள்ளும்
சங்கடத்தை தருவதாயிற்று!

இலங்கை பேருந்துகளில் இது சகஜம்
என்றாலும் இப்படியான சந்திப்பொன்று
நேர்ந்திருக்கவே கூடாது

பொது மக்கள் பேருந்தொன்றில் காவலாளி சகிதம்
விலங்கிடப்பட்டு சிறைக்கு அழைத்து வரப்பட்ட
தண்டனைக் கைதியாய்


எனது இருக்கைக்கு அருகாமையில்
எனது விடலை பருவத்து நண்பன் அவன்.

**எம்.ஐ. இஸ்ஸதீன்**
**உள்ளக கணக்காய்வுப் பகுதி**

**By - M.F.F. Farzana**

සටහන - රුක්ෂාන් සමරධීර

# කොක්කේ කතාව




සටහන - නිමල් ජයතිස්ස
ප්‍රධාන මෙහෙයුම් කළමණාකරු

හුක් (HOOk) එකක් යනුවෙන් සඳහන් කළහොත් එක්වරම ඔබේ මතකයට නැගෙන්නේ කෙළවර කවාකාරව නැවුනු ලෝහයෙන් නිර්මාණයවූ කොක්කකි. මෙය යමක් සම්බන්ධ කිරීමට, නැවීමට, එසවීමට හෝ ඇදබැඳ තබා ගැනීමට උපකාරී වේ.

අද සමාජයේ ව්‍යවාර භාෂාවෙන් ''කොක්කක් ඇද ගන්නවා'' යන්නෙන් අර්ථවත් වන්නේ අඩදබරයක් හෝ කලකෝලාහලයක් පටන් ගන්නවා යන්නයි. ''BY HOOk OR BY CROOK '' යන්න කොක්කෙන් හෝ කෙක්කෙන් අර්ථවක් වන්නේ හොඳින් හෝ නරකින් යම්කිසි දෙයක් ඉටු කරනවා යන්නයි. මේ හුක් (HOOK) එකක ආරම්භක අවධිය සේ අපට දක්නට ඇත්තේ කාන්තා ඇඳුමේ මූලික ආයිත්තමක් ලෙසටයි.

(HOOk) එකක් නිරන්තරයෙන්ම තවත් වස්තුවක් හෝ පාර්ශවයක් සමඟ සම්බන්ධ කිරීමට යොදා ගන්නකි. එහෙත් වරායකදි නම් හුක් (HOOK) එකක් යනුවෙන් හඳුන්වනුයේ වරාය සේවකයන්ගේ මෙවලමකි. සීනි, සහල්, පිටි, මාළු ගොඩබෑම පැටවීම සඳහා හුක්(HOOK) එකක අවශ්‍යතාවය අනිවාර්යය වී තිබුණි. එහෙත්, වර්තමානයේ පොලිතින් මලු සඳහා හුක්(HOOK) භාවිතය අවම කර ඇත.

සාම්ප්‍රදායික නෞකා මෙහෙයුම් කිරීමේ දී හුක් (HOOK) එක විශේෂත්ව ගණයේ ලා සැලකේ. එනම්, වරාය මෙහෙයුම් කටයුතුවලදී දියත් හා වාප්පු යනුවෙන් අංශ දෙකක් ඇති අතර, නෞකාවේ සිට ගොඩබිම (වාප්පු) දක්වා නෞකාවෙන් ගෙනන භාණ්ඩ රැගත් සිලිංගය හුක් (HOOK) එකන් නිදහස් කරන තෙක් වගකීම හා අයිතිය පැවරෙන්නේ දියත් අංශයටයි. නැතිනම් නෞකාවටයි. මෙහෙයුම් ක්‍රියාවලියේ දී හුක් (HOOK) එක එක්තරා සන්ධිස්ථානයක් හෝ කඩඉමක් ලෙසට ද සැලකිය හැකිය. භාණ්ඩ ගොඩබෑම හා පැටවීම සඳහා හුක් එකකින් ඉටුවන කාර්යභාරය හා ප්‍රභේද තීරණය වන්නේ එය ඔසවන භාණ්ඩවල බර ප්‍රමානය අනුවයි. භාණ්ඩ එසවිය හැකි ප්‍රමාණය (SWL) ලෙස සටහන් කර ඇත. ටොන් 1ක සිට මෙට්‍රික් ටොන් 3000 ක් එකවර එසවිය හැකි හුක් (HOOK) සහිත නෞකාවක් ලෝකයේ ඇති බවට කදිම නිදසුනක් නම් මෑතකදි කොළඹ දකුණු වාරයේ නැගෙනහිර පර්යන්තයේ (ECT) නැංගුරම්ලා තිබු '' SWIBER PJW 300 '' ඩොක් නෞකාවයි. ඒ අනුව කුඩා නෞකාවක් වුවද එසවිය හැකි දොඹකර සහිත හුක් (HOOK) අද ලෝකයේ දක්නට ඇත.

## ලෝක ශූරතා මේස පන්දු තරඟාවලිය සඳහා සුදුසුකම් ලබා ගැනීම වෙනුවෙන් ඉශාරා මධුරංගි තරඟ බිමේ

ලෝක ශූරතා මේස පන්දු තරඟාවලිය සඳහා සුදුසුකම් ලබාගැනීමේ තරඟාවලියට ජාතික කණ්ඩායම නියෝජනය කරමින් ඉශාරා මධුරංගි ස්වීඩනය බලා පසුගියදා පිටත්ව යන ලදී.

ඉශාරා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රීඩා සමාජය නියෝජනය කරන ක්‍රීඩිකාවකි.

## ජනසතු සේවා විවෘත කැරම් ශූරතාවය ශ්‍රී ලංකා වරාය අධිකාරියට

ආයතන 25 ක ක්‍රීඩකයන් 150 ක් පමණ තරඟ වදින ලද ජනසතු සේවා විවෘත කැරම් තරඟාවලියේ ශූරතාවය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විරාජ් හා එල්.කේ.එස්.පෙරේරා යන ක්‍රීඩකයින් සතුකර ගන්නා ලදී.

## අන්තර් සමාජ ක්‍රිකට් තරගාවලියේ තෙවන ස්ථානය ශ්‍රී ලංකා වරාය අධිකාරි ක්‍රිකට් සමාජයට

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, 2017- 18 වර්ෂය සඳහා සංවිධානය කළ අන්තර් සමාජ පළමුපෙල (Tier A) ක්‍රිකට් තරඟාවලිය අවසානයේ සමස්ථ ලකුණු සටහනේ තෙවැනි ස්ථානය හිමිකර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රිකට් සමාජය සමත්විය.

මෙම තරඟාවලියට සහභාගී වූ ප්‍රබල ක්‍රීඩා සමාජ අභිබවමින් ලබාගත් ප්‍රසාද ලකුණු ප්‍රමාණය 82.15 කි.

## සය සාමාජික ක්‍රිකට් තරගාවලියේ සියළු කාණ්ඩයන් හී ජය ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුකර ගනී








2018 වර්ෂය ආරම්භ කරමින් ජනසතු සේවා ක්‍රිකට් සංගමය විසින් සංවිධානය කරන ලද සය සාමාජික ක්‍රිකට් තරඟාවලියේ සියළු කාණ්ඩයන්හී ජය ශ්‍රී ලංකා වරාය අධිකාරිය හිමිකර ගැනීම විශේෂ අවස්ථාවක් විය.

පළමු පෙළ, දෙවන පෙළ හා ප්‍රවීන යන කාණ්ඩ තුනේම ජය ශ්‍රී ලංකා වරාය අධිකාරිය හිමිකර ගැනීම ජනසතු සේවා ක්‍රිකට් ඉතිහාසයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය නාමය සනිටුහන් කළ අවස්ථාවකි.



# සිංහයාට රැවටිලා



දුවේ පුතේ මම පුංචිම කාලේ වෙච්ච සිද්ධියක් තාම මතකයි. ඒක කතන්දරයක් වගේ නිසා අද මම ඔයාලට කියන්නම්.

ඔන්න එක දවසක් මහ රෑ එකපාරටම මට ඇහැරුණා. හරිම වතුර තිබහයි. ඇඳෙන් බැහැලා සෙරෙප්පු දෙක හෙවුවා හමුවුණේ නෑ. ඇඳ යට බැලුවා මගේ අම්මෝ සිංහයෙක් ඇද යට. මම කෑගහගෙන එක පිම්මේ ඇඳට පැන්නා. අම්මට අඬගහන්නත් බයයි. සිංහයාට ඇහුනොත් ඇඳට නැගලා මාව කයි කියලා බයයි. ඇස්දෙක තදින්ම පියාගත්තා. කවුද කාමරයට එන හඬක් ඇහෙනවා. තව සිංහයෙක්වත් ද ? හෙමිහිට ඇහැ ඇරලා බැලුවා. ආපු කෙනා ලයිට් දැම්මා, අම්මා ඇවිත් මගේ බය අඩුවුනා. අම්මා අහනවා ඇයි කෑගැහුවේ කියලා. මම ඇඳ යට පෙන්නුවා. අම්මා අත දා සිංහයාව ඇදලා ගත්තා. මගේ ජ'සිය සිංහ හම වගේ රෙද්දෙන් මහලා තිබුනේ. දැනුයි මට මතක් වුනේ නංගි සෙල්ලම් කරපු බව.

හා හා දැං නිදාගන්න

''පුතේ කවදාවත් සිංහයාට මිසක් සිංහ හමට බයවෙන්න එපා. මොකද කැලේ නරිත් සමහරවිට සිංහ හම පොරෝගෙන ඉන්නවා''

මෙහෙම කියපු අම්මා කාමරෙන් ගියා

අම්මා එදා කියලාදීපු පාඩම හැමදාමත් මගේ මතකයේ තියෙනවා.

**- දේවිකා නැන්දා -**

---

උඩින් උඩින් වර පෙත්තප්පු
බිමින් බිමින් වර පෙත්තප්පු
උඩින් උඩින් වර - බිමින් බිමින් වර
පිට්ටු කරන්න වර පෙත්තප්පු

තේක්ක මාමේ තේක්ක මාමේ
තේක්ක නැන්දා කොයි
සිංහල අවුරුදු තෑගි ගෙන්නනට
ගියා කොහෝ දෝ දූන්

ලියා එව්වේ - සත්මින් පංකජ
4 ශ්‍රේණිය
රම්බඩගල්ල මහා විද්‍යාලය
රම්බඩගල්ල

## අවුරුද්දට ඇහෙන රබන් පද

කැත්තක් අරගෙන වත්තට යනකොට
පෙත්තෙක් ඉඳගෙන කජු කනවා
ලංසි පැටව් මූදූ යන්න
නැවක් හදනවා
තකදොං නැවක් හදනවා

තත් තත් තරිකිට - තිත් තිත් තිරිකිට
තරිකිට තෙරිකිට තෙයි
තෙතෙයි තෙයි තරිකිට තිරිකිට තෙයි

අහසත් උල්ලන් ආහ් බාන්
පොළවත් අල්ලන් ආහ් බාන්
තරිකිට තෙරෙකිට තෙයි



**ඕංචිලි වාරම්**
පියුම්රා රසින්දි
3 වසර - අනුලා විද්‍යාලය



**කුරුළු කූඩුව**
නිජන් විරද ප්‍රසාද්
11 වසර - හේනේගම මධ්‍ය විද්‍යාලය



**ගොයම් කැපීම**
හසිත රසාජින
6 වසර - මහින්ද රාජපක්ෂ විද්‍යාලය



**නෙළුම් විල**
දිල්මි තෙහාරා
6 වසර - බප/ක සංඝමිත්තා බා. විද්‍යාලය

## A trip to a ruined city

During the last School vacation my family members and I went on a trip to Anuradhapura the first kingdom of ancient Sri Lanka'

Every body woke up early in the morning and got ready for this unforgettable trip. We were ablc to travel by the early morning train which started from Colombo. As my father is a government Servant. we could book first class Seats in the train. We reached Anuradhpura by about 10 am.

First we visited the Sri Lanka bodhi the most Sacred Bo Tree which we at respect very much. After worshiping it we visited Ruwanweliseya which was built king Dutugemunu Nevt we visited the Jethavana stupa which is recorded to be the highest stupa in the world. it is over 400 feet in height The structure has been built by king Mahasen Now it has been renovated, mirisawetiya is another stupa put up by king Dutugemunu My father told us an interesting legend centred around it.

However, as time was limited we could not visit many lpaces. we returned home by the evening train.

Gayashan p. Dias
Grade 10 B
Seethawaka National College
Avissawella

## අවුරුදු අවුරුදු

එක පැත්තකින් රබන් හඬ, තවත් පැත්තකින් කොහාගේ 'කුනු කුනුව, එරබදු ගස් රතට රටතේ මලින් බරවෙලා. ඇහැල ගස් කහ පාටින් මල් පුරෝගෙන. කුරුල්ලෝ නිල් අහසේ සතුටින් පියාඹනවා, මීමැස්සෝ බඹරුන් මලින් මලට රොන් ගෙන යනවා. පාසැල් නිවාඩු කාලයේ නිසා අපිට සෙල්ලම් කන්න ඇති තරම් කාලය තියෙනවා. අවුරුදු කාලෙට අපි අලුත් සෙල්ලම් ගොඩාක් කරනවා. ඔංචිලි පදිනවා. නිලාකුරු පත්තු කරනයා, කණා මුට්ටි බිඳිනවා, අලියාට ඇස තියනවා, තරගෙට කැවුම් කනවා,

අපිට ගොඩාක් තෑගි බෝග හම්බවෙනවා. අවුරුදු පුංචි අපිට ගොඩාක් සතුට ගෙනෙනවා.

බුද්ධිමා රාජකරුණා
4 ශ්‍රේණිය
බෞද්ධ කාන්තා විද්‍යාලය -කොළඹ

## එරබදු මල් ලස්සනයි

රතට රතේ රතු පාටින්
රන් රඹුටන් උඩ පනියි
තකට තකේ අලුත් බවින්
මැටි වළඳක් උඩ පනියි

නිලට නිලේ නිල් පාටින්
අහස අමුතු රටා මවයි
අවුරුද්දත් කිට්ටු කිට්ටු
එරබදු මල් ලස්සනයි

අදීශ් ආලෝක
5 ශ්‍රේණිය
පිලියන්දල මධ්‍ය විද්‍යාලය
පිළියන්දල

# වරායේ දියුණුවට
## වෘත්තීය සංගම් එකමුතු වේ



කොළඹ 10, බෝධිරාජ මාවත, අංක 06 ස්ථානයේ පිහිටි ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස් (පුද්) සමාගම මගින් මුද්‍රණය කරවා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මගින් ප්‍රසිද්ධ කරන ලදී.